**3**

**ශ්‍රේණිය**

# මූලික පිරිවෙන්
# ඉතිහාසය

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර
## Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් ඉතිහාසය මධ්‍ය හා අවසන් වාර පසුගිය ප්‍රශ්න පත්‍ර

www.pirivena.lk

# ඉතිහාසය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Tearm Test - 2018

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I,II
History I,II

කාලය : පැය තුන යි
Time : Three Hours

### ඉතිහාසය I

උපදෙස්

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා, දී ඇති උපදෙස් අනුව පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

**අංක 01 සිට අංක 15 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

01. "වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් ඉතිහාසය තේරුම්ගත යුතුය."මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා වන්නේ,

(i) ඩියඩෝරස් ය. (ii) ජී. එම්. ට්‍රෙවිලියන් ය.
(iii) පොලිබියස් ය. (iv) ඊ.එච්.කාර් ය.

02. රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ආසන්නයේ ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථානය කුමක් ද?

(i) පාහියන්ගල (ii) බෙලිලෙන
(iii) බටදොඹලෙන් (iv) අළුලෙන

03. ඔස්ට්‍රොලොයිඩ් නම් මානව වර්ගයාට අයත් වැඩුණු පිරිමි මානවයෙකුගේ උස ප්‍රමාණය කොපමණ ද?

(i) මීටර් 1.25 (ii) මීටර් 1.54
(iii) මීටර් 1.65 (iv) මීටර් 1.74

04. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගලේවෙල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රාග් ඓතිහාසික සුසානය කුමක් ද?

(i) පොම්පරිප්පුව (ii) ඉබ්බන්කටුව
(iii) ඉරණමඩු (iv) පිදුරන්ගල

05. මධ්‍යම කඳුකරයෙන් ආරම්භවන ලංකාවේ දිගම ගංගාව කුමක්ද?

(i) ගිං ගඟ (ii) වළවේ ගඟ
(iii) මැණික් ගඟ (iv) මහවැලි ගඟ

06. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට වර්ෂාව ලැබෙන්නේ මින් කුමන මාසවල ද?

(i) ඔක්තෝබර් - මාර්තු (ii) ඔක්තෝබර් - දෙසැම්බර්
(iii) ඔක්තෝබර් - අප්‍රේල් (iv) ඔක්තෝබර් - පෙබරවාරි


www.pirivena.lk

07. ආසියාවේ ස්ටෙප්ස් තණබිම් නිජබිම කරගත් ආර්ය ජන කණ්ඩායම් දෙකට බෙදී බටහිරට හා දකුණට සංක්‍රමණය වූයේ ?

(i) ක්‍රි.පූ. 1500 දී ය.
(ii) ක්‍රි.පූ. 1800 දී ය.
(iii) ක්‍රි.පූ. 2000 දී ය.
(iv) ක්‍රි.පූ. 2500 දී ය.

08. පණ්ඩුකාභය චරිතය අද්භූතජනක සිදුවීම්වලින් සරසා ඇති වංසකතාව වන්නේ,

(i) සමන්තපාසාදිකාව යි.
(ii) දීපවංසය යි.
(iii) බුත්සරණ යි.
(iv) මහාවංසය යි.

09. භද්දකච්චානා සමග පැමිණි පිරිස පිහිටුවාගත් ජනපදයක් ලෙස සැලකෙන්නේ,

(i) උපතිස්ස ගාම යි.
(ii) දීඝායු ගාම යි.
(iii) අනුරාධ ගාම යි.
(iv) උරුවේල ගාම යි.

10. බෞද්ධ අධ්‍යාපනය පදනම් කරගෙන විශ්වවිද්‍යාලයක් වන්නේ,

(i) ඕදන්තපුරි විශ්වවිද්‍යාලය යි.
(ii) වික්‍රමශීලා විශ්වවිද්‍යාලය යි.
(iii) කල්කටා විශ්වවිද්‍යාලය යි.
(iv) නාලන්දා විශ්වවිද්‍යාලය යි.

11. අනුරාධපුර යුගයේ දී රචනා කරන ලද ග්‍රන්ථයක් වන්නේ,

(i) සියබස්ලකර
(ii) සසදාවත
(iii) රසවාහිනිය
(iv) අමාවතුර

12. අනුරාධපුර යුගයේ බිහිවූ පිරිවෙන මින් කුමක්ද?

(i) සනානන්ද පිරිවෙන
(ii) මහින්ද සේල පිරිවෙන
(iii) දීඝසන්ධ පිරිවෙන
(iv) ආළාහන පිරිවෙන

13. මහනුවර යුගයේ දී ශාසනික ප්‍රබෝධයක් ඇති කළ, වර්ෂ 1747 සිහසුනට පත් වූයේ,

(i) නරේන්ද්‍රසිංහ රජු ය.
(ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ය.
(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.
(iv) රාජාධි රාජසිංහ රජු ය.

14. සරණංකර සංඝරාජයන් වහන්සේගෙන් ධර්ම විනය උගත් හිමි නමක් වන්නේ,

(i) සිටිනාමළුවේ ධම්මජෝති හිමි ය.
(ii) ඉඳුරුවේ සුමංගල හිමි ය.
(iii) වලානේ සිද්ධාර්ථහිමි ය.
(iv) වස්කඩුවේ සුභූති හිමි ය.

15. පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතිය සඳහා ක්‍රි.ව. 1902 දී ආරම්භ කරන ලද ආයතනය කුමක්ද?

(i) විද්‍යෝදය විශ්වවිද්‍යාලය
(ii) ප්‍රාචීන භාෂෝපකාර සමාගම
(iii) අධ්‍යාපන කොමිෂන් සභාව
(iv) විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය


www.pirivena.lk

අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැලපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

16. (i) දුටුගැමුණු රජු (ii) ධාතුසේන රජු
(iii) නිශ්ශංකමල්ල රජු (iv) වසභ රජු

17. (i) අභයගිරිය සෑය (ii) රන්කොත් සෑය
(iii) ජේතවන සෑය (iv) රුවන්වැලි මහා සෑය

18. (i) පණ්ඩුකාභය (ii) පණ්ඩු
(iii) පාරින්ද (iv) බුද්ද පාරින්ද

19. (i) නිසබණ (ii) වේදය
(iii) ප්‍රාතිමොක්ෂය (iv) ත්‍රිපිටකය

20. (i) පරෙවි සන්දේශය (ii) ගිරා සන්දේශය
(iii) මයුර සන්දේශය (iv) හංස සංදේශය

» අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

21. (i) ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි (ii) බුදුගුණාලංකාරය - වීදාගම මෛත්‍රෙය හිමි
(iii) කාව්‍යශේඛරය - තොටගමුවේ රාහුල හිමි (iv) සද්ධර්මරත්නාවලිය - වේදේහ හිමි

22. (i) තොටගමුව - විජයබා පිරිවෙන (ii) රයිගම - සුණානන්ද පිරිවෙන
(iii) දෙවිනුවර - ඉරුගල්කුලතිලක පිරිවෙන (iv) කෑරගල - පද්මාවතී පිරිවෙන

23. (i) කලා වැව - ධාතුසේන රජු (ii) මහ විලච්චිය - වසභ රජු
(iii) සොරබොර වැව - දුටුගැමුණු රජු (iv) තිසා වැව - පණ්ඩුකාභය රජු

24. (i) ගල්ඔය - විජිත ගාම (ii) කලා ඔය - උරුවේල ගාම
(iii) කනාදරා ඔය - උපතිස්ස ගාම (iv) මල්වතු ඔය - අනුරාධ ගාම

25. (i) බටදොඹලෙන - රත්නපුර (ii) බෙලි ලෙන - කෑගල්ල
(iii) බෙල්ලන්බැඳි පැලැස්ස - නුවරඑළිය (iv) පාහියන්ගල ලෙන - කළුතර


www.pirivena.lk

» අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති A , B ,C ,D යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදි වේ. එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

26. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම,

A. ඉන්දියානු අර්ධද්වීපයට දකුණින් පිහිටයි.

B. ඉන්දියාවෙන වෙන් වන්නේ කිලෝමීටර් තිස් හතරකිනි.

C. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65710 කි

D.දකුණු ආසියාවේ විශාලතම දූපතයි.

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) A සහ D

27. වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ,

A. මහනුවර සූරියගොඩ විහාරස්ථානයෙ දී මුල්ම පිරිවෙන ආරම්භ කරන ලදි.

B. වර්ෂ 1689 ජූනි 29 උන්වහන්සේගේ උපත සිදුවිය.

C. ලෙව්කේ රාළහාමිගෙන් බලාවතාරයේ නාම කාණ්ඩයත්, සතිපට්ඨාන සූත්‍රයත් ප්‍රගුණ කිරීම.

D. ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරයෙහි උසස් විද්‍යාස්ථානයක් ඇති කිරීම.

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) A සහ D

28. ආදී මානවයාගේ ජීවන රටාව,

A. ගොවිතැන ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය විය

B. ඔවුන්ගේ වාසස්ථාන ලෙස ස්වභාවික ගල් ගුහා භාවිතා කළහ

C. ආදී මානවයා දියලුණු භාවිතා කොට ඇත

D. සංකීර්ණ මෙවලම් භාවිතා කොට ඇත

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) A සහ D

29. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන,

A. ඉතිහාසය හැදෑරීමෙන් පුද්ගල පෞරුෂය සංවර්ධනය වේ.

B. බහු සංස්කෘතික සමාජයක ගැටුම් ඇතිවේ.

C. ඉතිහාසය හැදෑරීමෙන් අන් මතවලට ගරු නොකරයි.

D. යමක් පැහැදිලි ව සාක්ෂි සහිත ව විස්තර කරලිමේ කුසලතාව ඇතිවේ.

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) A සහ D


www.pirivena.lk

පණ්ඩුකාභය රාජ්‍ය සමය,

A. අනුරාධපුර නගරය පාලනය සඳහා නගරගුත්තික නම් තනතුර ඇතිකරන ලදි.

B. ඔහුගේ දසවන රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා ලකුණු කරන ලදි.

C. තිසා වැව මෙතුමාගේ රාජ්‍ය සමයේ ඉදිකරන ලද්දකි.

D. මොහු විසින් මුළු දිවයිනම එක්සේසත් කරන ලදි.

(i) A සහ B
(ii) B සහ C
(iii) C සහ D
(iv) A සහ D

» අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාමප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. ඒවා ගැළපෙන අනු පිළිවෙලට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.

31.

| X | Y |
|---|---|
| I. වෘක්ෂ වන්දනාව | A - බෝධි වන්දනාව බවට පත්වීම |
| II. පර්වත වන්දනාව | B - ස්ථූප වන්දනාව බවට පත්වීම |
| III. මළවුන් පිදීම | C - පහන් පූජා ලෙස සැකසීම |
| IV. ගිනි පූජා | D – ප්‍රාප්ති දානමය පිංකම් ලෙස පරිවර්තනය වීම |

(i) BADC
(ii) DBAC
(iii) ABDC
(iv) ACBD

32.

| X | Y |
|---|---|
| I. ක්‍රි.පූ. 161 - 137 | A - වළගම්බා රජු |
| II. ක්‍රි.පූ. 89 - 77 | B - දුටුගැමුණු රජු |
| III. ක්‍රි.ව. 67 - 111 | C - ධාතුසේන රජු |
| IV. ක්‍රි.ව. 459 - 477 | D – වසභ රජු |

(i) BADC
(ii) BDAC
(iii) ABDC
(iv) CABD

33.

| X | Y |
|---|---|
| I. බමුණාට | A - පුරෝහිත තනතුර |
| II. මහා අරිට්ඨ | B - සේනාපති තනතුර |
| III. ආමාත්‍යවරයාට | C - සිටු තනතුර |
| IV. ගණකාමාත්‍යවරයාට | D – දණ්ඩනායක තනතුර |

(i) BADC
(ii) DBAC
(iii) ABDC
(iv) ACBD


www.pirivena.lk

34. X | Y

I. දීඝ ගාමිණී
II. මුටසීව
III. කාවන්තිස්ස
IV. ධාතුසේන

A - දුටුගැමුණු
B - දේවනම්පියතිස්ස
C - කාශ්‍යප
D – පණ්ඩුකාභය

(i) BADC (ii) DBAC

(iii) ABDC (iv) CABD

35. X | Y

I. බෝධිඝරය
II. චේතියඝරය
III. පටිමාඝර
IV. උපෝසථාගාර

A - ස්තූපවල ආරක්ෂාවට
B - බුද්ධ ප්‍රතිමාවේ ආරක්ෂාවට
C - බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට
D – විනය කර්ම සිදු කිරීමට

(i) BADC (ii) DBAC

(iii) ABDC (iv) CABD

» ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දක්වෙන I,II,III,IV යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරාගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| අංකය | පළමු වන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| I | නිවැරදිය | නිවැරදිය |
| II | නිවැරදිය | වැරදිය |
| III | වැරදිය | වැරදිය |
| IV | වැරදිය | නිවැරදිය |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | පිළිතුරු |
|---|---|---|---|
| 36. | ශ්‍රී ලංකාව පළමුවරට එක්සේසත් කළේ දුටුගැමුණු රජතුමාය. | කාවන්තිස්ස රජතුමා යුද්ධයකට අවශ්‍ය සියලු දෑ සකස් කර තිබුණි. | (........) |
| 37. | ත්‍රිපිටකය කටපාඩමින් රැගෙන ආ මහ තෙරුවරු "භාණක" නමින් හැඳින්වේ. | "භාණක" මහ තෙරවරුන් ධර්ම කරුණු පදයෙන් පදය විස්තර කළහ. | (........) |
| 38. | නවක භික්ෂූන් වසර දහයක් උපාධ්‍යායන් වහන්සේ සමීපයේ සිටිය යුතුය. | ස්ථවිර භික්ෂූන් වහන්සේලා ලෙස හඳුන්වන්නේ උපසම්පදාවෙන් වසර පහකට පසුවය. | (........) |
| 39. | දඹදෙණි පිරිවෙන් අධ්‍යාපනයේ නියමුවන් ලෙස තොටගමුවේ රාහුල හිමියන් කටයුතු කොට ඇත. | " ෂඩ්භාෂා පරමේශ්වර" නාමයෙන් තොටගමුවේ රාහුල හිමියන් හඳුන්වා ඇත. | (........) |
| 40. | "සාරාර්ථ සංග්‍රහය" වැනි ග්‍රන්ථ රැසක් වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ රචනා කොට ඇත. | තායිලන්තයට දූතයන් යවා ලංකාවේ උපසම්පදාව ඇති කිරීමට සරණංකර සංඝරාජයන් වහන්සේ කටයුතු කළහ. | (........) |


www.pirivena.lk

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I,II
History I,II

කාලය : පැය තුන යි
Time : Three Hours

ඉතිහාසය I

උපදෙස්

» මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
» එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා, දී ඇති උපදෙස් අනුව පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.
» මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

» අංක 01 සිට 15 තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

01. ඉතිහාසය යනු මිනිසුන් පිළිබඳ කෙරෙන අධ්‍යයනයක් බව ප්‍රකාශ කළේ,

(i) පොලිබියස් ය. (ii) ඊ. එච්. කාර් ය.
(iii) ඩියඩෝරස් ය. (iv) ශ්‍රී ජවහර්ලාල් නේරු ය.

02. සියලු විෂයයන් අන්තර්ගත ගෘහය ඉතිහාසය බව ප්‍රකාශ කළේ,

(i) ශ්‍රී ජවහර්ලාල් නේරු ය. (ii) මහත්මා ගාන්ධි ය.
(iii) ජී. එම්. ට්‍රෙව්ලියන් ය. (iv) සෝනියා ගාන්ධි ය.

03. ඉතිහාසයේ පියා ලෙස හඳුන්වන්නේ,

(i) ප්ලීනි ය. (ii) ප්‍රකෝසියස් ය.
(iii) හෙරඩෝටස් ය. (iv) සෙනරත් පරණවිතාන ය.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් විශාල ම ලෙන වන්නේ,

(i) පොම්පරිප්පු ලෙන ය. (ii) පාහියන්ගල ලෙන ය.
(iii) බටදොඹ ලෙන ය. (iv) අළු ලෙන ය.

05. ෆාහියන් ලෙන පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේ ද?

(i) කළුතර (ii) රත්නපුර
(iii) කෑගල්ල (iv) ගාල්ල

06. බලන්ගොඩ මානවයා අයත් වන්නේ කුමන මානව වර්ගයට ද?

(i) මධ්‍ය ධරණී (ii) මොන්ගොලොයිඩ්
(iii) ඇල්ෆයින් (iv) ඔස්ට්‍රොලොයිඩ්

07. අපේ රටේ ප්‍රධාන ජන වර්ගයක් <u>නොවන්නේ,</u>

(i) දෙමළ (ii) සිංහල

(iii) මැලේ (iv) මුස්ලිම්

08. රාජ්‍ය අයිතිය හා රාජ්‍ය අනන්‍යතාව තහවුරු කරන සංකේතය කුමක්ද?

(i) ජාතික කොඩිය (ii) ජාතික ගීය

(iii) රාජ්‍ය ලාංඡනය (iv) ජාතික ක්‍රීඩාව

09. රාජ්‍ය ලාංඡනයේ ඇති රූප අතරින් සශ්‍රීකත්වය හා සෞභාග්‍යයේ සංකේතය කුමක්ද?

(i) වී කරල (ii) පුන්කලස

(iii) සිංහයා (iv) ධර්ම චක්‍රය

10. ලෝවාමහාපාසාදය,

(i) අභයගිරි විහාරික භික්ෂූන්ගේ පෝය ගෙය වේ. (ii) මහා විහාරික භික්ෂූන්ගේ පෝය ගෙය වේ.

(iii) චේතියගිරි විහාරික භික්ෂූන්ගේ පෝය ගෙය වේ. (iv) ඉසුරුමුණි විහාරික භික්ෂූන්ගේ පෝය ගෙය වේ.

11. දකුණු ආසියාවේ ඇති විශාලම දූපත,

(i) සුමාත්‍රා දූපත යි. (ii) මාලදිවයින යි.

(iii) ශ්‍රී ලංකාව යි. (iv) ජාවා දූපත යි.

12. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර්,

(i) 85610 වේ. (ii) 75610 වේ.

(iii) 65610 වේ. (iv) 55610 වේ.

13. ශ්‍රී ලංකාවේ පැරණි ම වංසකථාව,

(i) බෝධිවංසය යි. (ii) ථූපවංසය යි.

(iii) මහාවංසය යි. (iv) දීපවංසය යි.

14. ආර්යයන් මුලින් ම ලංකාවට පැමිණියේ,

(i) ක්‍රි. පූ. 7 සියවසේ ය. (ii) ක්‍රි. පූ. 6 වන සියවසේ ය.

(iii) ක්‍රි. පූ. 1 සියවසේ ය. (iv) ක්‍රි. ව. 1 සියවසේ ය.

15. පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය උපදේශකයා වූයේ,

(i) පණ්ඩුල බ්‍රාහ්මණයා ය. (ii) තීය බ්‍රාහ්මණයා ය.

(iii) චන්ද්‍ර බ්‍රාහ්මණයා ය. (iv) උපතිස්ස බ්‍රාහ්මණයා ය.

» අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැලපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

16. (i) ඉට්ඨිය (ii) උත්තිය

(iii) සම්බල (iv) බණ්ඩුක

17. (i) මල්වතු ඔය (ii) කනදරා ඔය

(iii) කලා ඔය (iv) ගල් ඔය

18. (i) මහාවංසය (ii) සමන්තපාසාදිකාව

(iii) දීපවංසය (iv) දළදා සිරිත

19. (i) පරියත්ති (ii) පටිපත්ති

(iii) පටිවේධ (iv) පටිසම්භිධාන

20. (i) චෝලකුලාන්ත පිරිවෙන (ii) ආළාහන පිරිවෙන

(iii) දීඝසන්ධ පිරිවෙන (iv) මහින්දසේල පිරිවෙන

» අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

21. (i) ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රෙය හිමි (ii) ගුත්තිල කාව්‍ය - වැත්තෑවේ හිමි

(iii) පැරකුම්බා සිරිත - තොටගමුවේ රාහුල හිමි (iv) සද්ධර්මරත්නාකරය - ධම්මදින්න විමලකිත්ති හිමි

22. (i) තොටගමුව - පද්මාවතී පිරිවෙන (ii) දෙවිනුවර - ඉරුගල්කුලතිලක පිරිවෙන

(iii) එරබත්තොට - ධර්මරාජ පිරිවෙන (iv) වීදාගම - සනානන්ද පිරිවෙන

23. (i) සමන්තපාසාදිකාව - අනුරාධපුර යුගය (ii) මුවදෙව්දාවත - පොළොන්නරු යුගය

(iii) සද්ධර්මරත්නාවලිය - කෝට්ටේ යුගය (iv) සිංහල බෝධිවංසය - කුරුණෑගල යුගය

24. (i) දේවානම් පියතිස්ස රජු- මහා විහාරය (ii) ධාතුසේන රජු - අවුකන විහාරය

(iii) වසභ රජු - මිරිසවැටිය (iv) මහාසේන රජු - ජේතවන විහාරය

25. (i) යෝධවැව - ධාතුසේන රජතුමා (ii) මින්නේරි වැව - කිත්සිරිමෙවන් රජතුමා

(iii) මහවිලච්චිය වැව - වසභ රජතුමා (iv) අභය වැව - පණ්ඩුකාභය රජතුමා

» අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති A , B ,C ,D යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදි ය, එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

26. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A. අතීතයෙන් වර්තමානයට අවශ්‍ය පාඩම් ඉගෙනීමට හැකි වේ.

B. පෞරුෂ ගති ලක්ෂණ උද්දීපනය නොවේ.

C. සංස්කෘතික අර්බුදයන් ඇති වීමට මග පෑදේ.

D. දේශානුරාගය හා ජාතිකාභිමානය වර්ධනය වේ.

(i) B සහ D (ii) D සහ C

(iii) B සහ C (iv) A සහ D

27. ආර්යයන්ගේ ලංකාගමනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙකක් වන්නේ,

A. දකුණු ඉන්දියාවේ කාවේරි පටුනේ සිට මෙරටට පැමිණීම.

B. විජය ඇතුළු පිරිස ගෝකණ්ණතිත්ථ වරායට ගොඩ වැදුණි.

C. භද්දකච්චායනාගේ සොහොයුරන් නැගෙනහිර ප්‍රදේශයේ ජනාවාස ගොඩනගා ගත්හ.

D. උරුවෙල ගාම, විජිත ගාම පැරණි ආර්ය ජනපද දෙකක් වේ.

(i) A සහ C ය. (ii) B සහ C ය.

(iii) C සහ D ය. (iv) B සහ D ය.

28. ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීමේ දේශපාලනික බලපෑම් පිළිබඳ ප්‍රකාශ දෙකක් වන්නේ,

A. මෙරටේ දේශපාලන බලය ස්ථාවරවීම

B. දෙරටේ රාජ වංස අතර ආවාහ විවාහ සම්බන්ධතා ඇතිවීම

C. අනුරාධපුර රාජධානියේ බිඳවැටීම බලපෑම

D. අනුරාධපුර යුගයේ දෙරට අතර වාණිජ සම්බන්ධතා ඇතිවීම

(i) A සහ B (ii) B සහ C

(iii) A සහ D (iv) C සහ D

29. මෙරටේ ජාතික වෘක්ෂය,

A. බුදුන් වහන්සේලා සිව්දෙනෙක් බුද්ධත්වයට පත්වීමට සෙවන ලබා දුන් වෘක්ෂයකි

B. සර්ප විෂ හා ප්‍රධාන රෝගාබාධ රැසකට ඖෂධ සහිත වෘක්ෂයකි

C. උඩරට ප්‍රදේශයේ පමණක් වැවෙන වෘක්ෂයකි

D. එය ජාතික වෘක්ෂය බවට පත් කර ගන්නේ 1886 පෙබරවාරි 26 දිනය

(i) A සහ B (ii) B සහ C

(iii) A සහ D (iv) C සහ D

30. ප්‍රාග් ඓතිහාසික යුගයේ,

A. සංකීර්ණ සමාජ ක්‍රමයක් පැවතුණි.

B. මිනිසුන්ගේ වාසස්ථාන ගල්ගුහා වේ.

C. භාවිත කළ මෙවලම් සකසා ගන්නේ යකඩ හා වෙනත් ලෝහ වලින් ය.

D. බොහෝ විට භාවිත කළ වස්ත්‍රාභරණ මිය ගිය පසු සුසානවල තැම්පත් කොට ඇත.

(i) A සහ B (ii) B සහ C

(iii) C සහ D (iv) B සහ D

» අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම-ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. ඒවා ගැළපෙන අනු පිළිවෙලට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.

31.

| X | Y |
| --- | --- |
| I. මහාවංසය | A - බුද්ධඝෝෂ හිමි |
| II. සමන්ත පාසාදිකාව | B - තොටගමුවේ රාහුල හිමි |
| III. භක්ති ශතකය | C - මහානාම හිමි |
| IV. පරවි සන්දේශය | D – ශ්‍රී රාම චන්ද්‍ර භාරතී |

(i) ABDC (ii) BCAD

(iii) CADB (iv) DABD

32.

| X | Y |
| --- | --- |
| I. මල්වතු ඔය | A - ගෝණ නදී |
| II. කලා ඔය | B - මහාවාලුකා නදී |
| III. මහවැලි ගඟ | C - ජජ්ජර නදී |
| IV. දැදුරු ඔය | D – කදම්බ නදී |

(i) ACDC (ii) ABCD

(iii) BACD (iv) DABC

33.

| X | Y |
| --- | --- |
| I. චේතිය පබ්බත | A - දිඹුලාගල |
| II. අරිට්ඨ පබ්බත | B - සිතුල්පව්ව |
| III. චිත්තල පබ්බත | C - මිහින්තලය |
| IV. දුමරක්ඛ පබ්බත | D – රිටිගල |

(i) ABCD (ii) BDCA

(iii) CDBA (iv) DABC

34.

| X | Y |
|---|---|
| I. සූරතිස්ස රාජ්‍ය සමය | A - සයද්‍රවිඩ ආක්‍රමණය |
| II. අසේල රාජ්‍ය සමය | B - සේන,ගුත්තික ආක්‍රමණය |
| III. වලගම්බා රාජ්‍ය සමය | C - එළාර ආක්‍රමණය |
| IV. මිත්තසේන රාජ්‍ය සමය | D – සත්ද්‍රවිඩ ආක්‍රමණය |

(i) ABCD (ii) BCDA

(iii) CABD (iv) DABC

35.

| X | Y |
|---|---|
| I. දීපවංසය | A - අනුරාධපුර යුගය |
| II. ධර්මප්‍රදීපිකාව | B - පොළොන්නරු යුගය |
| III. දළදා සිරිත | C - කෝට්ටේ යුගය |
| IV. සුභාෂිතය | D – කුරුණෑගල යුගය |

(i) ABDC (ii) BACD

(iii) CADB (iv) DBAC

» ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන I,II,III,IV යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරාගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

| අංකය | පළමු වන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| I | නිවැරදිය | නිවැරදිය |
| II | නිවැරදිය | වැරදිය |
| III | වැරදිය | වැරදිය |
| IV | වැරදිය | නිවැරදිය |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | පිළිතුරු |
|---|---|---|---|
| 36. | ආදි මානවයා වාසස්ථාන ලෙස භාවිත කළේ ගල්ගුහාය. | කිතුල්ගල කැණීම්වලින් කුඩා ලිප් හමුවී ඇත. | (........) |
| 37. | ත්‍රිපිටකය කටපාඩමින් රැගෙන ආ මහ -තෙරුවරු ''භාණක'' නමින් හැඳින්වේ. | මහසෙන් රාජ්‍ය සමයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදී. | (........) |
| 38. | දීඝගාමය මහවැලි ගඟ සමීපයේ පැවති පැරණි ජනාවාසයකි | ආර්යයන් ඉන්දියාවේ ලෝනා හෝ කාවේරි වරායන්වල සිට ලංකාවට පැමිණ ඇත. | (........) |
| 39. | වාරියපොළ ශ්‍රී සුමංගල හිමි 1873 විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළහ. | රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි 1875 විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කළහ | (........) |
| 40. | ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා 1880 දී පරම - විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවන ලදී. | 1967 අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛස්ථානය දෙන ලදී | (........) |

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

**ඉතිහාසය II**

**සැලකිය යුතුයි**

- » පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- » පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- » මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.

01.

I. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

(1). මහාතිත්ථ (2). අනුරාධපුරය (3). කලාවැව

(4). වළවේ ගඟ (5). දීඝ ගාමය (6). කෝට්ටේ

(ලකුණු 1 x 6 = 6)

II. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(අ). රූපයේ දක්වෙන ඓතිහාසික ස්ථානය කුමක්ද ?

(ආ). මෙය පිහිටි දිස්ත්‍රික්කය නම් කරන්න.

(ඉ). මෙහි තිබී සොයා ගත් සාධක මොනවාද?

(ලකුණු 1 x 3 = 3)

A රූපය

III.



(අ). B රූපයේ දැක්වෙන කොඩිය කුමක් ද?

(ආ). කහපාට පසුබිමෙන් කියවෙන්නේ කුමක් ගැනද?

(ඉ). මුළු හතරේ ඇති නෙළුම් මල්වලින් අර්ථවත් කරන්නේ කවුරුන්ද?

B රූපය

(ලකුණු 1 x 3 = 3)

02.

(i). දැනට සොයාගෙන ඇති උතුරු ප්‍රදේශයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථාන දෙකක් නම් කරන්න.

(II). ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය දෙකක් දක්වන්න.

(III). ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

03.''**ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩ ගැසීම කෙරෙහි භූගෝලීය පිහිටීම බලපාන ලදී**''

(I). මෙරට ඉතිහාසය හැඩ ගැසීමට බලපෑ බාහිර භූගෝලීය සාධක දෙකක් නම් කරන්න.

(II). ශ්‍රී ලාංකේය සමාජයේ ඒකවරණයට හේතු වූ අභ්‍යයන්තර භූගෝලීය සාධක දෙකක් පහදන්න.

(III). ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය කෙරෙහි බාහිර භූගෝලීය පිහිටීම බලපෑ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

04. ''**දේවානම්පියතිස්ස රාජ්‍ය සමය ලංකා ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයක් වේ**''

(I). දෙවන පැතිස් රාජ්‍ය සමයට පෙර මෙරටේ පැවති ආගමික විශ්වාස දෙකක් නම් කරන්න.

(II). අශෝක අධිරාජයා හා දේවානම්පියතිස්ස රජු අතර පැවැති සම්බන්ධතාව කෙටියෙන් දක්වන්න.

(III). දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ වැදගත්කම ආගමික සංස්කෘතික කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 +4 +6 = 12)

05. ''**ලෝකේ පැරණි ම අධ්‍යාපනය බෞද්ධ අධ්‍යාපනය වේ**''

(I). ඉන්දියාවේ පැවති පැරණි බෞද්ධ විශ්වවිද්‍යාල දෙකක් නම් කරන්න.

(II). අනුරාධපුර යුගයේ බෞද්ධ අධ්‍යාපනය දියුණුවීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.

(III). දඹදෙණි යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ ඇති වූ ප්‍රබෝධය නිදසුන් දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 +4 +6 = 12)

06. (I). වසභ රාජ්‍ය සමයේ ශක්තිමත් රාජ්‍ය පාලනයක් පැවති බව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(II). ධාතුසේන රජුගේ වාරි කර්මාන්ත සේවාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6 +6 = 12)

07) (I). වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමිගේ ආගමික ශාසනික සේවාවේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(II). ජාතික පුෂ්පය ලෙස නිල් මානෙල් මල තෝරා ගැනීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 6 +6 = 12)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු විස්තර කරන්න.

(I). ඉතිහාසය හැදෑරීමේ ඇති ප්‍රයෝජන

(II). පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඇති වැදගත්කම

(III). දුටුගැමුණු මහ රජුගේ ශ්‍රේෂ්ඨත්වය

(iv). පොළොන්නරු රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය

(ලකුණු 6 +6 = 12)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**03 ශ්‍රේණිය/**Grade **03**

ඉතිහාසය II
History II



සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு _பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை- 2022
**Mid Year Term Test - 2022**

පැය එකයි

**ඉතිහාසය - I** විභාග අංකය : ............................................ **3 ශ්‍රේණිය**

**සැලකිය යුතුය.**
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

➢ ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. මේ අතරින් ඉන්දියානු ඉතිහාසඥයෙක් වන්නේ,
1) ජවහල්ලාල් නේරු 2) ජී.එච්.ට්‍රෙව්ලියන්
3) ඊ. එච්. කාර් 4) පොලිබියස්

02. ඉතිහාසය හැදෑරීමේ වටිනාකමක් නොවන්නේ,
1) අතීතය හඳුනාගැනීම. 2) ජාතීන් අතර අසමගිය ඇතිවීම.
3) අනාගතය සකසා ගැනීම. 4) ජාතික අභිමානය වර්ධනය.

03. ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නොවන්නේ මින් කුමක් ද?
1) පාහියන්ගල 2) කිතුල්ගල 3) පොම්පරිප්පු 4) ඉබ්බාගමුව

04. රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථානයකි,
1) බටදොඹ ලෙන 2) බෙලිලෙන 3) බූන්දල 4) ඉරණමඩු

05. නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි පැරණි ජනාවාසයකි,
1) උරුවෙලගාම 2) උපතිස්සගාම 3) දීඝගාම 4) කාජරගාම

06. ශ්‍රී ලංකාවේ වර්ග ප්‍රමාණය,
1) වර්ග කිලෝමීටර් 65410 කි. 2) වර්ග කිලෝමීටර් 65510 කි.
3) වර්ග කිලෝමීටර් 65610 කි. 4) වර්ග කිලෝමීටර් 65710 කි.

07. ශ්‍රී ලංකාවේ පළල ගණනය කරන්නේ,
1) ගාල්ලේ සිට මඩකලපුව 2) කොළඹ සිට සංගමන් කන්ද
3) මීගමුවේ සිට සේරුවාවිල 4) මෝදර සිට ත්‍රිකුණාමලය

08. ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේ,
1) ටිබෙටයට ආසන්නව පිහිටීම ය. 2) කාම්බෝජය ආසන්නව පිහිටීම ය.
3) චීනයට ආසන්නව පිහිටීම ය. 4) ඉන්දියාවට ආසන්නව පිහිටීම ය.

09. මේ අතුරින් වයඹ දිග වෙරළේ පිහිටා ඇති වරායකි,
1) මහාතිත්ථ 2) ජම්බුකෝළපට්ටන 3) ගෝකණ්ණතිත්ථ 4) ගොඩවාය

10. පණ්ඩුකාභය රජතුමා ඉදිකළ වාරිකර්මාන්තයකි,
1) මින්නේරිය වැව 2) තිසා වැව 3) යෝධ වැව 4) අභය වැව

11. නගර ගුත්තික යනු,
1) ගම් පාලනය ප්‍රධානියා ය. 2) ප්‍රධාන දොරටුපාලකයා ය.
3) නගර පාලනයේ ප්‍රධානියා ය. 4) රාෂ්ට්‍ර පාලනයේ ප්‍රධානියා ය.

12. පිතු මහරජ ලෙස හැඳින්වෙන්නේ,
1) සද්ධාතිස්ස රජු ය. 2) වළගම්බා රජු ය.
3) වසභ රජු ය. 4) මහානාම රජු ය.

13. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ,
1) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ ය. 2) දුටු ගැමුණු රාජ්‍ය සමයේ ය.
3) පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ය. 4) වට්ටගාමිණී අභය රාජ්‍ය සමයේ ය.

14. අමාවතුර සහ සසඳාවත රචනා කළේ,
1) අනුරාධපුර යුගයේ ය. 2) පොළොන්නරු යුගයේ ය.
3) දඹදෙණි යුගයේ ය. 4) සීතාවක යුගයේ ය.

15. ශ්‍රී රාමචන්ද්‍ර විහාරති මෙරටට පැමිණියේ,
1) මහනුවර යුගයේ ය. 2) ගම්පොළ යුගයේ ය.
3) කෝට්ටේ යුගයේ ය. 4) කුරුණෑගල යුගයේ ය.

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒ නම් අතරින් එක් නමක් කවර හෝ නිසා නොගැළපේ. එම නාමයට අදාළ අංකය තෝරා අදාළ අංකය ලකුණු කරන්න.**

16. 1) නා ගස 2) තල් ගස 3) ඇසතු ගස 4) අඹ ගස

17. 1) ධර්මචක්‍රය 2) බෝ පත් 3) වී කරල් 4) පුන්කලස

18. 1) මූලික පිරිවෙන 2) මහ පිරිවෙන 3) විද්‍යාලංකාර පිරිවෙන 4) විද්‍යායතන පිරිවෙන

19. 1) කාව්‍යශේඛරය 2) පරවි සන්දේශය 3) සැළලිහිණි සන්දේශය 4) ලෝවැඩ සඟරාව

20. 1) වීදාගම හිමි 2) වැත්තෑවේ හිමි 3) සංඝරාජ හිමි 4) තොටගමුවේ රාහුල හිමි

➢ **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල පද යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගල පදයක් එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා ලකුණු කරන්න.**

21. 1) මහා කාව්‍යය - කාව්‍යශේඛරය 2) උපදේශ කාව්‍ය - ගුත්තිල කාව්‍ය
3) ප්‍රශස්ති කාව්‍ය - පැරකුම්බා සිරිත 4) සංදේශ කාව්‍ය - තිසර සන්දේශය

22. 1) දේවානම්පියතිස්ස රජතුමා - මහා විහාරය
2) දුටුගැමුණු රජතුමා - මිරිසවැටිය
3) වළගම්බා රජතුමා - සෝමාවතී චෛත්‍යය
4) ධාතුසේන රජතුමා - ජේතවන විහාරය

23. 1) ගල්ඔය - විජිතගාම 2) කලාඔය - උරුවෙලගාම
3) මල්වතුඔය - අනුරාධගාම 4) කනදරාඔය - උපතිස්සගාම

24. 1) වෘක්ෂ වන්දනාව - බෝධි වන්දනාව 2) පර්වත වන්දනාව - ස්තූප වන්දනාව
3) ගිනි පූජාව - පහන් පූජාව 4) සති පූජාව - අනිමිසලෝචන පූජාව

25. 1) දික්සඳ සෙනෙවි - අනුරාධපුර යුගය 2) මහින්ද සේල පිරිවෙන - දඹදෙණිය යුගය
3) මහේන්ද්‍රබාහු පිරිවෙන - කුරුණෑගල යුගය 4) වීදාගම පිරිවෙන - කෝට්ටේ යුගය



www.pirivena.lk

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා ඇසුරින් දෙකක් පමණක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා අදාළ පිළිතුරු සලකුණු කරන්න.**

26. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය,
  A - ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ඇසුරෙන් නිර්මාණය කර ඇත.
  B - එම නිර්මාණ කමිටුවේ ලේකම්වරයා සෙනරත් පරණවිතාන මහතා ය.
  C - එහි ඇති බෝපත් සතරෙන් චතුරාර්ය සත්‍ය අර්ථවත් වේ.
  D - ජාතික කොඩිය ඕනෑම උත්සව අවස්ථාවක ඔසවා තැබීමට අවසර ඇත.
  1) A හා B  2) B හා C  3) D හා C  4) B හා D

27. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම නිසා,
  A - ලංකාවට විදේශ ආක්‍රමණ එල්ල විය.
  B - ශ්‍රී ලංකාවේ කතෝලික ආගම ව්‍යාප්ත විය.
  C - ඉන්දියාවේ කලා සම්ප්‍රදායන් වල ආභාසය ලැබුණි.
  D - මෙරට ස්වාධීනත්වය ට තර්ජනයක් නොවීය.
  1) A හා B  2) B හා C  3) C හා D  4) A හා D

28. ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය,
  A - ඉංග්‍රීසි අධ්‍යාපනයට සමගාමීව ගොඩ නැගී ඇත.
  B - බුද්ධාගම මුල්කරගත් අධ්‍යාපන ක්‍රමයකි.
  C - කෝට්ටේ යුගය එහි ස්වර්ණමය යුගය යි.
  D - මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබුණි.
  1) A හා B  2) A හා C  3) B හා D  4) C හා D

29. අනුරාධපුර යුගයේ වාරි කර්මාන්තය,
  A - අභය වැව ඉදිකළේ දේවානම්පියතිස්ස රජු ය.
  B - මහ වැව් ඉදිකළ පළවෙනි පාලකයා දුටුගැමුණු රජු ය.
  C - වසභ රජු වැව් 11 ක් සහ ඇළ මාර්ග 12 ක් තනවා ඇත.
  D - ජය ග`. හෙවත් යෝධ ඇළ ධාතුසේන රජු විසින් කරවන ලදී.
  1) A හා B  2) B හා C  3) C හා D  4) D හා C

30. දේවානම්පියතිස්ස රාජ්‍ය අවධිය,
  A - මෙකල ඉන්දියාවේ මගධ පාලකයා සමුද්‍රගුප්ත රජු ය.
  B - දූමින්දාගමනය සිදුවූයේ මෙම රාජ්‍ය සමයේ දී ය.
  C - මිහිඳු මහරහතන් වහන්සේ යාපහුවට වැඩම කළේ ය.
  D - බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කොට ථූපාරාම චෛත්‍යය ඉදි කරන ලදී.
  1) A හා B  2) Cහා D  3) D හා A  4) B හා D

➢ **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න සඳහා x හා y තීරුවල නාම පද ප්‍රකාශන සමූහයක් දී ඇත. එහෙත් ඒවා දක්වා ඇත්තේ, ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරය x තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.**

31.
| | |
|---|---|
| 1) බුද්ධඝෝෂ හිමි | A මහාවංස කතුවරයා ය. |
| 2) මහානාම හිමි | B දේශාටන භික්ෂුවකි. |
| 3) පාහියන් හිමි | C මහායාන භික්ෂුවකි. |
| 4) සංඝමිත්‍ර හිමි | D අටුවාචාර්ය භික්ෂුවකි. |

  1) A , B , C , D  2) B , A , D , C  3) C , D , B , A  4) D , A , B , C

32.
| | |
|---|---|
| 1) සද්ධර්මරත්නාකරය | A දෙවන පරාක්‍රමබාහු රජු |
| 2) කව් සිළුමිණ | B ධම්මදින්න විමලකිත්ති හිමි |
| 3) භක්ති ශතකය | C කර්තෘ අඥාතය |
| 4) එළු සිලෝ ශතකය | D ශ්‍රී රාමචන්ද්‍ර විභාරතී |

  1) A , C , B , D  2) B , A , D , C  3) C , A , B , D  4) D , C , A , B


www.pirivena.lk

33. 1) ඉර සහ සඳ — A බෞද්ධ විමුක්ති මාර්ගයේ පරම නිෂ්ඨාව වන නිවන් සුවය යි.
2) සිංහයා — B සෞභාග්‍ය සංකේතවත් කරවන රාජ්‍ය ලාංඡනයේ ඇත.
3) නෙළුම්මල් හතර — C ජාතික ධජයේ හා රාජ්‍ය ලාංඡනයේ ඇත.
4) වීකරල — D රාජ්‍ය ලාංඡනයේ ඇත.

1) A , B , C , D  2) B , A , D , C  3) C , D , B , A  4) D , A , B , C

34. 1) ආනන්ද සමරකෝන් — A ලංකාවට අත්පන්දු ක්‍රීඩාව හඳුන්වා දීම.
2) ජී. ජී පොන්නම්බලම් — B ජාතික ගීයේ නිර්මාතෘ.
3) එස් .එම් සෙනෙවිරත්න — C රාජ්‍ය ලාංඡනය නිර්මාතෘ.
4) රොබට් වෝල්ටර් — D ජාතික කොඩිය නිර්මාණ කමිටුවේ සාමාජිකයෙකි.

1) A , D , C , B  2) B , D , C , A  3) C , A , B , D  4) D , C , A , B

35. 1) මහාබෝධි සමාගම — A ශ්‍රී සරණංකර සංඝරාජ හිමි
2) සිල්වත් සමාගම — B අනගාරික ධර්මපාල තුමා
3) පරම විඥානාර්ථ සමාගම — C ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා
4) ප්‍රාචීන භාෂෝපකාර සමාගම — D හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

1) B , A , D , C  2) C , D , A , B  3) D , A , B , C  4) A , B , C , D

➢ **අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණය | පළමු ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| ප්‍රශ්න අංකය | පළමු ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | දෙවන පරාක්‍රමබාහු රජු ගල්විහාර කතිකාවත කරවන ලදී. | මහා පරාක්‍රමබාහු රජු විසින් දඹදෙණි කතිකාවත කරවන ලදී. | |
| 37. | මහාවිහාරය ථෙරවාදී බෞද්ධ අධ්‍යාපන කේන්ද්‍රස්ථානය විය. | අභයගිරි විහාරය මහායාන බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය විය. | |
| 38. | මිත්තසේන රාජ්‍ය අවධියේ සත් ද්‍රවිඩ නමින් ආක්‍රමණයක් එල්ල විය. | මහසෙන් රජු එම සත් ද්‍රවිඩ ආක්‍රමණයන් පරාජය කර බලයට පත් විය. | |
| 39. | ඉසිගිරි නම් අමාත්‍යවරයා රජුගේ රෝහණයේ සිටි පාලකයා විය. | වසභ රජු චිත්තල පබ්බත නම් දර්ශනීය ස්තූපයක් කරවන ලදී. | |
| 40. | දෙවන ධර්ම සංගායනාවෙන් පසු අශෝක අධිරාජ්‍යා මෙරට ඇතුළු රටවල් හයකට ධර්මය ප්‍රචාරය කරන ලදී. | මෙරටින් මගධයට ගිය දූත පිරිසේ සිටි අරිට්ඨ කුමරුට සේනාධිපති තනතුර ප්‍රදානය කරන ලදී. | |

(1 × 40 = 40 ලකුණු)


www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு_பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை- 2022**
**Mid Year Term Test - 2022**

පැය දෙකයි

**ඉතිහාසය - II** **3 ශ්‍රේණිය**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. I. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | |
|---|---|---|
| 1. අනුරාධගාම | 2. කලා වැව | 3. ඌරාතොට |
| 4. විජිතගාම | 5. මැණික් ගඟ | 6. ත්‍රිකුණාමලය |

(ලකුණු06)

➢ පහත දී ඇති රූප සටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A

II. a. A රූපයේ දැක්වෙන බුද්ධ ප්‍රතිමාව හඳුන්වන නම කුමක් ද?

b. එය කර වූ පාලකයා කවුරුන් ද?

c. එය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

(ලකුණු03)



B

III. a. B රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

b. එය කර වූ පාලකයා කවුරුන් ද?

c. එය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක් ද?

(ලකුණු 03)

02. I. ඉතිහාසය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කළ ඉතිහාසඥයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන දෙකක් දක්වන්න. (ලකුණු 04)

(ලකුණු 04)

III. මෙරට ප්‍රාග් ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගෙන ඇති ස්ථාන දෙකක් පිළිබඳ විස්තර සඳහන් කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

(ලකුණු 06)

03. I. මෙරට ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍ර කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මෙරට ඉතිහාසය හැඩගැසීමට බලපෑම් කරන බාහිර භූගෝලීය සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මෙරට ගංගා පද්ධතිය ඉතිහාසය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I. ලංකාවට පැමිණි ආර්ය කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහින්දාගමනයට පෙර පැවති ආගමික ඇදහිලි හා විශ්වාසයන් හතරක් දක්වන්න. (ලකුණු 04)

III. අනුරාධපුර මුල් කොටගත් රාජ්‍යයක් ගොඩනැගීමට පණ්ඩුකාභය රජතුමා ගත් ක්‍රියාමාර්ගයන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. I. අනුරාධපුර රාජධානිය පාලනය කළ මෞර්ය රාජවංශයට අයත් පාලකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

II. රෝහණය මාගම වටා එක් කිරීමට කාවන්තිස්ස රජතුමා ගත් ක්‍රියාමාර්ගයන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ලකුණු 04)

III. දුටුගැමුණු රජතුමාගේ ආගමික සේවාවන් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. I. වලගම්බා රජු මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. එකල සිදු වූ ආගමික සේවාවන් දෙකක් දක්වන්න. (ලකුණු 04)

III. වසභ රජුගේ අවධියේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. I. ඉතිහාසය විෂය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මහායාන අධ්‍යාපන පරමාර්ථ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. කෝට්ටේ යුගයේ අධ්‍යාපන ආයතන තුනක් සහ එකල සිටි උගතුන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 06)

08. I. ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

(ලකුණු 04)

III. ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා හතරක් සහ එහි දී සැලකිල්ලට ගනු ලබන කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
KOg; gjpg;Gupik cilaJ]
All rights reserved]


අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு _பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை- 2022
**Mid Year Term Test - 2022**

පැය දෙකයි

**ඉතිහාසය - II** **3 ශ්‍රේණිය**

දෙවන පත්‍රයේ ප්‍රශ්න අංක 01 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිතා කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න. විභාග අංකය. .............................



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Term Test – 2023

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **3 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ''වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් ඉතිහාසය තේරුම් ගත යුතුය.'' මෙය කාගේ නිර්වචනයක් ද?
1. ශ්‍රී ජවහල්ලාල් නේරු 2. ජී.එම්.ට්‍රෙවිලියන් 3. ඊ.එච්.කාර් 4. ඩියඩෝරස්

02. බලංගොඩ මානවයා කුමන මානව වර්ගයකට අයත් වේ ද?
1. ඔස්ට්‍රොලොයිඩ් 2. මොංගොලොයිඩ්
3. නීග්‍රොයිඩ් 4. කෝකසයිඩ්

03. කොළඹ සිට සංගමන්කන්ද තුඩුව අතර දුර ප්‍රමාණය කොපමණද?
1. 432km 2. 228 km 3. 224 km 4. 372km

04. තමාට එල්ල වූ තර්ජන හමුවේ දකුණු ඉන්දියානු කුලී හමුදාවල සහය ලබා ගත් දේශීය පාලකයෙකු නොවන්නේ මින් කවරෙක් ද?
1. අභයනාග 2. පළමු වන මුගලන් 3. ධාතුසේන 4. ඉලනාග

05. ලක්දිවට පැමිණි භාරතීය ජන සංක්‍රමණ පිළිබඳ තොරතුරු දැක්වෙන විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ කුමක් ද?
1. සමන්ත පාසාදිකාව 2. පාහියන් වාර්තාව 3. මහාවංසය 4. වලාහස්ස ජාතකය

06. ශ්‍රී ලංකාවේ ගිණිකොන ප්‍රදේශයේ හා වයඹ දිග ප්‍රදේශයේ ජීවත් වූ ජන කණ්ඩායම් දෙක එක් කළ පාලකයා කවුරුන්ද?
1. දේවානම්පියතිස්ස 2. වසභ 3. පණ්ඩුකාභය 4. දුටුගැමුණු

07. පණ්ඩුකාභය රජු විසින් වෙස්සවණ දෙවියන් උදෙසා වෙන් කරන ලද වෘක්ෂය කුමක් ද?
1. නුග ගස 2. බෝ ගස 3. කොහොඹ ගස 4. තල් ගස

08. බුද්ධ ප්‍රතිමාවල ආරක්ෂාව උදෙසා ඉදි කරන ලද්දේ මේ අතුරින් කුමක් ද?
1. බෝධිඝර ය. 2. චෛතියඝර ය. 3. උපෝසථාඝර ය. 4. පටිමාඝර ය.

09. හල්ලුක නැමැති විදේශීය සතුරෙකුට විරුද්ධව සටන් කිරීමට සිදු වූ දේශීය පාලකයා කවුරුන් ද?
1. පළමු වන විජයබාහු 2. වසභ 3. දුටුගැමුණු 4. මුටසීව

10. වසභ රජුගේ ''උතර'' නම් පුත්‍රයා පිළිබඳව තොරතුරු සඳහන් වන ශිලා ලේඛනය මින් කුමක් ද?
   1. කුමවෝලෙයි ශිලා ලිපිය
   2. තම්මැන්නාව ශිලා ලිපිය
   3. හැබැස්ස ශිලා ලිපිය
   4. තෝණිගල ශිලා ලිපිය

11. මහායාන අධ්‍යාපනය මෙරට හඳුන්වා දීමේ පුරෝගාමියෙකු නොවන්නේ,
   1. පාහියන් හිමි
   2. මහානාම හිමි
   3. අමෝඝවජ්‍ර හිමි
   4. සංඝමිත්‍ර හිමි

12. පොලොන්නරු යුගයේ දී රචනා කරන ලද ග්‍රන්ථයකි,
   1. දළඳා සිරිත
   2. දම්පියා අටුවා ගැටපදය
   3. රසවාහිනිය
   4. දීපවංසය

13. සද්ධර්මරත්නාකරය නම් ගද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන් ද?
   1. තොටගමුවේ රාහුල හිමි
   2. වීදාගම මෛත්‍රී හිමි
   3. වෑත්තෑවේ හිමි
   4. ධම්මදින්න විමලකිත්ති හිමි

14. ''පරම විඥානාර්ථ සමාගම'' ආරම්භ කරන ලද්දේ කිනම් වර්ෂයක දී ද?
   1. 1875
   2. 1873
   3. 1880
   4. 1882

15. 1885 දී අත්පන්දු ක්‍රීඩාව ලොවට හඳුන්වා දෙන ලද්දේ කවුරුන් විසින් ද?
   1. හර්කියුලිස් රොබින්සන්
   2. විලියම් ජී.මෝගට්
   3. රොබට් වෝල්ටර්
   4. විලියම් ග්‍රෙගරි

- **16 - 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. රුවන්වැලි මහා සෑය 2. මිරිසවැටිය 3. ලෝවාමහාපාය 4. ථූපාරාමය

17. 1. දාඨිය 2. පාරින්ද 3. පුලහත්ථ 4. තිරිතර

18. 1. ආළාහන පිරිවෙන 2. මහාවිහාර පිරිවෙන 3. දීඝචංකමන පිරිවෙන 4. කාලාපාසාද පිරිවෙන

19. 1. සේලාන්තර මූල 2. කප්පර මූල 3. දක්ෂිණ මූල 4. විල්ගම්මුල

20. 1. සිංහල බෝධිවංසය 2. මුනිගුණාලංකාරය 3. සාරාර්ථ සංග්‍රහය 4. සතර බණවර සන්නය

- **21 - 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබාදී ඇත. ඒවා අතුරෙන් එක් යුගලක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21. 1. නුවරඑළිය - හෝර්ටන් තැන්න
   2. රත්නපුරය - බටදොඹ ලෙන
   3. කෑගල්ල - කිතුල්ගල බෙලිලෙන
   4. කළුතර - අත්තනගොඩ අළුලෙන

22. 1. සොරබොර වැව - දුටුගැමුණු
   2. ජය වැව - පණ්ඩුකාභය
   3. හිරිවඩුන්න - වසභ
   4. මහවිලච්චිය - ධාතුසේන

23. 1. අමාවතුර - පොලොන්නරුව
   2. බුත්සරණ - කුරුණෑගල
   3. සමන්තපාසාදිකාව - අනුරාධපුර
   4. පූජාවලිය - දඹදෙණිය

24. 1. කැරගල - පද්මාවතී පිරිවෙණ
   2. තොටගමුව - විජයබා පිරිවෙණ
   3. දෙව්නුවර - ඉරුගල්කුලතිලක පිරිවෙණ
   4. වීදාගම - මහාපාය පිරිවෙණ

25. 1. ඕල්කට් තුමා - මහා බෝධි සමාගම
   2. සිද්ධාර්ථ හිමි - පරම ධම්ම චේතිය පිරිවෙණ
   3. සුමංගල හිමි - විද්‍යෝදය පිරිවෙණ
   4. ධම්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙණ

- **අංක 26 - 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. පිරිවෙන් ධජය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

A. ක්‍රි. ව. 2003.03.03 දින පැවති නියෝජිත මහ සභාවේ දී මෙය අනුමත කර ගන්නා ලදී.

B. ක්‍රි. ව. 1972 දී පිරිවෙන් ධජයේ මුළු හතරේ තිබූ පැරණි සංකේත හතර වෙනුවට වර්තමානයේ පවතින බෝපත් හතර එකතු කර ඇත.

C. ලංකාවේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ඇසුරෙන් මෙය නිර්මාණය විය.

D. මෙහි ධර්ම චක්‍රය ඉදිරියේ ඇති පහන ඥානාලෝකයෙන් ධර්මා ලෝකයට පිවිසීම සංකේතවත් කරයි.

1. B සහ C ය. 2. A සහ B ය. 3. A සහ D ය. 4. C සහ D ය.

27. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටීමෙන් ඇති වූ දේශපාලනික බලපෑම් සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. රාජ්‍ය පාලනයේ දී ගාමිණී, පුරෝහිත, සේනාපති, භාණ්ඩාගාරික, නගර පාලනයේ දී නගර ගුත්තික වැනි රාජ්‍ය නිලධාරී පිරිසක් බිහි වීම.

B. දෙරටේ රාජ්‍ය වංශ අතර ආවාහ විවාහ සබඳතා ඇති කර ගැනීම.

C. රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට මෙන් ම සහෝදරයාගෙන් සහෝදරයාට උරුම වීම.

D. රාජාණ්ඩු පාලන ක්‍රමය දේශීය පරිසරයට අනුව සකස් වීම.

1. B සහ C ය. 2. A සහ B ය. 3. A සහ D ය. 4. C සහ D ය.

28. පණ්ඩුකාභය රජතුමාගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

A. අනුරාධපුරය අගනුවර කර ගැනීම.

B. ග්‍රාම සීමා ලකුණු කිරීම.

C. රෝහණය එක්සේසත් කිරීම.

D. දිගාමඩුල්ල ප්‍රදේශය සහලින් සංවර්ධනය කිරීම.

1. B සහ C ය. 2. A සහ B ය. 3. A සහ D ය. 4. C සහ D ය.

29. වළගම්බා රජු මුහුණ දුන් අභියෝග සම්බන්ධව නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. හල්ලුකගේ ආක්‍රමණය

B. තීය බ්‍රාහ්මණයා විසින් ඇති කරන ලද කැරැල්ල

C. බැමිණිතියාසාය

D. මාඝගේ ආක්‍රමණය

1. B සහ C ය. 2. A සහ B ය. 3. A සහ D ය. 4. C සහ D ය.

30. පොලොන්නරු රාජධානි සමයෙහි පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධ නිවැරදි තොරතුර වන්නේ,

A. ථේරවාදී ආරාමික අධ්‍යාපනයට ලෞකික විෂය සම්මිශ්‍රණය වීම.

B. මෙකල පැවති පිරිවෙන් අධ්‍යාපන තත්ත්වය පිළිබඳ තොරතුරු ගිරා සංදේශයෙහි සඳහන් වේ.

C. ''මූල'' යන නමින් හැඳින් වූ ගුරුකුල අට ''මූලායතන'' නමින් හැඳින්වීම.

D. කාලවාපී පිරිවෙණ එකල පැවති ප්‍රකට පිරිවෙනකි.

1. B සහ C ය. 2. A සහ B ය. 3. A සහ C ය. 4. C සහ D ය.

- **31 - 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. වී කරල් | A. ධාර්මිකභාවය හා සාධාරණත්වය |
| 2. ධර්ම චක්‍රය | B. සදාකාලික පැවැත්ම |
| 3. ඉර සහ සඳ | C. සශ්‍රීකත්වය |
| 4. නෙළුම් පෙති | D. පිවිතුරු බව |

1. A B C D 2. C A B D 3. C B A D 4. D A C B

32.

| X | Y |
|---|---|
| 1. ථූපාරාම දාගැබ | A. වළගම්බා රජතුමා |
| 2. ලෝවාමහාපාය | B. දුටුගැමුණු රජතුමා |
| 3. අභයගිරි දාගැබ | C. පණ්ඩුකාභය රජතුමා |
| 4. සිවිකාසාලා | D. දේවානම්පියතිස්ස රජතුමා |

1. B C A D 2. A D B C 3. D B A C 4. D B C A

33.

| X | Y |
|---|---|
| 1. කාලපාසාද පිරිවෙණ | A. පොලොන්නරු යුගය |
| 2. දෙවුන්දර නන්ද පිරිවෙණ | B. අනුරාධපුර යුගය |
| 3. ජේතවනාරාම පිරිවෙණ | C. කෝට්ටේ යුගය |
| 4. තොටගමුවේ විජයබා පිරිවෙණ | D. දඹදෙණි යුගය |

1. B D A C 2. C A D B 3. D A C B 4. A B D C

34.

| X | Y |
|---|---|
| 1. මහා කාව්‍ය | A. කාව්‍යශේඛරය |
| 2. ප්‍රශස්ති කාව්‍ය | B. ලෝවැඩ සඟරාව |
| 3. වෛද්‍ය ග්‍රන්ථ | C. පැරකුම්බා සිරිත |
| 4. උපදේශ කාව්‍ය | D. භේසජ්ජ සංග්‍රහය |

1. A B D C 2. C B D A 3. D A C B 4. A C D B

35.

| X | Y |
|---|---|
| 1. වෘක්ෂ වන්දනාව | A. ස්තූප වන්දනාව |
| 2. පර්වත වන්දනාව | B. ප්‍රාප්ති දානමය පිංකම් |
| 3. ගිනි පූජා | C. බෝධි වන්දනාව |
| 4. මළවුන් පිදීම | D. පහන් පූජා |

1. B D A C 2. C A D B 3. D A C B 4. C B A D

- 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | නා ගසෙහි උද්භිද විද්‍යාත්මක නාමය ''Mesua nagassarium'' නමින් හැඳින්වේ. | රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ පුරාවිද්‍යා චක්‍රවර්තී එස්.එම්.සෙනෙවිරත්න නම් චිත්‍ර ශිල්පියා විසිනි. |
| 37. | 1943 අධ්‍යාපන අමාත්‍ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා විසින් පිරිවෙන් උපදේශන සභාවක් පත් කරන ලදී. | 1959 අධ්‍යාපන අමාත්‍ය ජේ.ආර්.ජයවර්ධන මහතා පිරිවෙන් වර්ග කොට ව්‍යවස්ථා මාලාවක් සම්මත කරන ලදී. |
| 38. | ශ්‍රී රාම චන්ද්‍රභාරතී මහායාන අධ්‍යාපනය මෙරටට හඳුන්වාදීමේ පුරෝගාමියෙකු ලෙස සැලකේ. | පොලොන්නරු යුගයේ භික්ෂු ජීවිතය කොටස් තුනකට බෙදා අධ්‍යාපනය ලබා දෙන ලදී. |
| 39. | මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිසට ''**පරාභව සූත්‍රය**'' ඇසුරින් ධර්මය දේශනා කරන ලදී. | රුවන්වැලිසෑය ලක්දිව ප්‍රථම ඓතිහාසික චෛත්‍යය ලෙස පිළිගැනේ. |
| 40. | වසභ රජු ලම්භකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා ය. | අවුකන හිමි පිළිම වහන්සේ දුටුගැමුණු රාජ සමයට අයත් නිර්මාණයකි. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය - 2023**
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Term Test – 2023

**ඉතිහාසය - II** **3 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. මිනිහා ගල් කන්ද 2. පොලොන්නරුව 3. මහාතිත්ථ
4. වලවේ ගඟ 5. පුත්තලම 6. මඩකලපුව

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මෙම රූපයේ දැක්වෙන ස්තූපය කුමක් ද?
(ආ) එය කරවූ රජතුමා කවුරුන් ද?
(ඉ) මෙම ස්තූපයේ නිධන් කර ඇත්තේ බුදුන් වහන්සේගේ කිනම් ධාතූන් වහන්සේ ද?


A රූපය

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයේ සිංහයාගෙන් අර්ථවත් වන්නේ කුමක් ද?
(ආ) මෙම ලාංඡනය නිර්මාණය කරනු ලැබූ චිත්‍ර ශිල්පියා කවුරුන් ද?
(ඉ) මෙහි දැක්වෙන ඉර සහ සඳ මගින් සංකේතවත් කරනු ලබන්නේ කුමක් ද?


B රූපය

(ලකුණු 1 × 3 = 3)

02. i. භද්දකච්චායනාගේ සොහොයුරන් විසින් පිහිටුවා ගත් ජනපද දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පැතිරී තිබූ ස්ථාන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

03. i. ලක්දිවට පැමිණි භාරතීය ජන සංක්‍රමණ පිළිබඳ තොරතුරු දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලෝකයේ බිහි වූ මුල් ම විශ්වවිද්‍යාල හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මහින්දාගමනය හා ලක්දිව බුදුදහම පිහිටුවීම පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

04. i. සෙල්ලිපිවලින් හෙළි වන වසභ රජුගේ පුතුන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02)

ii. වසභ රජු විසින් නිර්මාණය කරන ලද වාරි කර්මාන්ත හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. එම රජුගේ ප්‍රාදේශීය පාලන ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් විසින් රචිත කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. පංච මහා වාද අතුරෙන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින පිරිවෙන් වර්ග පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

06. i. මහායාන අධ්‍යාපනය මෙරටට හඳුන්වා දීමේ පුරෝගාමීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. පොලොන්නරු යුගයේ පැවති මූලායතන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. කෝට්ටේ රාජධානි සමය සිංහල සාහිත්‍යයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගයක් ලෙසින් සැලකිය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. i. වර්තමානයේ ශ්‍රී ලංකාවේ භාවිත වන භාෂා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ජාතික කොඩියේ නිර්මාතෘ කමිටුවේ සාමාජිකයන් හතර දෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ජාතික පක්ෂියා නම් කොට, ඔහු ජාතික පක්ෂියා ලෙස තෝරා ගැනීමට බලපෑ හේතු පහක් සඳහන් කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකාවලින් **දෙකකට** කෙටි සටහන් සපයන්න.

i. දේවානම්පියතිස්ස රජතුමා

ii. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි

iii. ධාතුසේන රජතුමා

iv. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම

(ලකුණු 6 × 2 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]


අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

# මධ්‍ය වාර පරීක්ෂණය - 2023
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
Mid Term Test – 2023

## ඉතිහාසය - II

සැලකිය යුතුයි :

❖ දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා බාර දෙන්න.






www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2024

## 3 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - I,II

| 07 | S | I,II |
|---|---|---|

පැය තුනයි.

අමතර කියවීම් කාලය - විනාඩි 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## ඉතිහාසය - I පත්‍රය

**සැලකිය යුතුයි :**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**

---

➢ **අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. **"වර්තමානය හා අනාගතය අනිවාර්යයෙන් ම ඉතිහාසයෙන් ගොඩ නැගෙන අතර එම මුද්‍රාව එහි දක්නට ලැබෙනු ඇත."** මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා කවුරුන් ද?
    (1) ජී.ඒච්.ට්‍රෙවිලියන්  (2) ඊ.එච්.කාර්
    (3) ඩියඩෝරස්  (4) ශ්‍රී ජවහර්ලාල් නේරු

02. **"ඉතිහාසයේ පියා"** ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන් ද?
    (1) පොලිඩියර්ස්  (2) සෙනරත් පරණවිතාන
    (3) හෙරඩෝටස්  (4) මහත්මා ගාන්ධි

03. බලංගොඩ ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථානය වන්නේ මින් කුමක් ද?
    (1) අලුලෙන  (2) පාහියංගල ලෙන
    (3) බෙල්ලන්බැඳිපැලැස්ස  (4) ඉරණමඩුව

04. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය කොපමණ ද?
    (1) $65610km^2$  (2) $65320\ km^2$  (3) $75610km^2$  (4) $65611km^2$

05. සමනල කන්දෙන් ආරම්භ වී දකුණු පළාතෙන් මුහුදට වැටෙන ප්‍රධාන ගංගාව කුමක් ද?
    (1) කැළණි ගඟ  (2) වලවේ ගඟ  (3) කළු ගඟ  (4) මහවැලි ගඟ

06. මහා පරාක්‍රමබාහු රජුගේ පාණ්ඩ්‍ය වංශික කුමාරිකාව කවුරුන් ද?
(1) කල්‍යාණවතී (2) ලීලාවතී (3) අනුලා (4) සාමා

07. ලංකාවට පැමිණි ආර්යයන් විසින් මල්වතු ඔය අසල පිහිටුවා ගත් ජනපදය මින් කුමක් ද?
(1) උපතිස්සගාම (2) අනුරාධගාම (3) විජිතගාම (4) උරුවෙලගාම

08. පණ්ඩුකාභය රජුගේ වැඩිමහල් මාමාට අනුරාධපුර නගරය ආරක්ෂා කිරීම සඳහා ලබා දුන් තනතුර කුමක් ද?
(1) නගර ගුත්තික (2) බඩගරික (3) මහලේකම් (4) අසිග්ග්‍රාහක

09. මහින්දාගමනයෙන් පසු ලක්දිව ඉදි වූ ප්‍රථම ඓතිහාසික ස්තූපය කුමක් ද?
(1) ගිරිහඬුසෑය (2) ථූපාරාමය
(3) කණ්ඨක චේතිය (4) අභයගිරිය

10. අපේ රටේ ප්‍රධාන ජන වර්ගයක් නො වන්නේ මින් කුමක් ද?
(1) සිංහල (2) මැලේ (3) දෙමළ (4) මුස්ලිම්

11. මිහිඳු මහ රහතන් වහන්සේ විසින් දෙවනපෑතිස් රජු ඇතුළු පිරිසට ප්‍රථමයෙන් දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?
(1) චූල්ලහත්ථිපදෝපම (2) ආසිවිසෝපම
(3) බාල පණ්ඩිත (4) ගිරිමානන්ද

12. වළගම්බා රජු විසින් ආරාමයක් ඉදි කර පෞද්ගලිකව පූජා කරන ලද්දේ කිනම් භික්ෂූන් වහන්සේට ද?
(1) සාලිය හිමිට (2) කුපික්කලතිස්ස හිමිට
(3) මහානාම හිමිට (4) මුගලන් හිමිට

13. ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය අධ්‍යයනයට ඇති පැරණි ම වංසකතාව කුමක් ද?
(1) මහාවංසය (2) චූලවංසය (3) ථූපවංසය (4) දීපවංසය

14. ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ කළ වර්ෂය කුමක් ද?
(1) ක්‍රි.ව. 1867 (2) ක්‍රි.ව. 1900 (3) ක්‍රි.ව. 1902 (4) ක්‍රි.ව. 1916

15. "පරම විඥානාර්ථ සමාගම" ආරම්භ කළ වර්ෂය කුමක් ද?
(1) ක්‍රි.ව. 1880 (2) ක්‍රි.ව. 1890 (3) ක්‍රි.ව. 1713 (4) ක්‍රි.ව. 1892

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නො ගැළපේ. එම නො ගැළපෙන නාමය තෝරන්න.**

16. (1) දුටුගැමුණු රජු (2) වළගම්බා රජු
(3) වසභ රජු (4) මහා පරාක්‍රමබාහු රජු

17. (1) අවුකන විහාරය (2) රුවන්වැලි සෑය
(3) මිරිසවැටිය (4) ලෝවාමහාපාය

18. (1) ජේතවනාරාම පිරිවෙන (2) ආලාහන පිරිවෙන
(3) මහින්ද සේන පිරිවෙන (4) මහින්දසේල පිරිවෙන

19. (1) සිංහල ජාතක පොත (2) සද්ධර්මරත්නාවලිය
(3) දළදා සිරිත (4) සිංහල බෝධිවංසය

20. (1) පණ්‍යමාර (2) පණ්ඩු
(3) පාරින්ද (4) බුද්ද පාරින්ද

➢ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.**

21. (1) නුවරඑළිය - හෝර්ටන් තැන්න
(2) කෑගල්ල - අළුලෙන
(3) රත්නපුර - පාහියංගල
(4) උතුරු ප්‍රදේශය - පොම්පරිප්පුව

22. (1) කාචරගාම - මැණික් ගඟ අසල
(2) උරුවෙලගාම - කලා ඔය අසල
(3) විජිතගාම - ගල්ඔය අසල
(4) උපතිස්සගාම - කනදරා ඔය අසල

23. (1) ජය වැව - පණ්ඩුකාභය රජතුමා
(2) මහවිලච්චිය වැව - වසභ රජතුමා
(3) කලා වැව - ධාතුසේන රජතුමා
(4) හිරිවඩුන්න - දේවානම්පියතිස්ස රජතුමා

24. (1) ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රිය හිමි
(2) ගුත්තිල කාව්‍යය - තොටගමුවේ රාහුල හිමි
(3) කෝකිල සංදේශය - ඉරුගල්තිලක පිරිවෙන්පති හිමි
(4) සද්ධර්මරත්නාකරය - ධම්මදින්න විමලකිත්ති හිමි

25. (1) මහාකාව්‍ය - කාව්‍යශේඛරය
(2) වෛද්‍ය ග්‍රන්ථ - යෝග රත්නාකරය
(3) කෝෂ ග්‍රන්ථ - රුවන් මල්දම
(4) උපදේශ කාව්‍ය - බුදුගුණාලංකාරය

➢ **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A) , (B) , (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

(A) සහ (B) පමණක් නිවැරදි නම් අංක 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් අංක 2 ද,
(B) සහ (D) පමණක් නිවැරදි නම් අංක 3 ද,
(A) සහ (D) පමණක් නිවැරදි නම් අංක 4 ද, සලකුණු කරන්න.

26. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම,
A. ඉන්දියාවට ආසන්නව පිහිටා ඇත.
B. දකුණු ආසියාවේ ඇති විශාල ම දූපතකි.
C. ඉන්දියාවෙන් වෙන් වන්නේ කිලෝමීටර් තිස්තුනකිනි.
D. කොළඹ සිට සංගමන්කන්ද දක්වා දුර ප්‍රමාණය කිලෝමීටර් 225 කි.

27. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජන වන්නේ,

A. අතීතයෙන් පාඩම් ඉගෙනීමට.
B. අන්‍ය මතවලට ගරු නො කිරීම.
C. අන්‍ය සංස්කෘතීන් අගය නො කිරීම.
D. ජාතික සමගිය ගොඩනගා ගැනීමට.

28. පණ්ඩුකාභය රජතුමාගේ දේශපාලනය සම්බන්ධව නිවැරදි ප්‍රකාශ වන්නේ,

A. ග්‍රාම සීමා ලකුණු කිරීම.
B. අනුරාධපුරය අගනුවර කර ගැනීම.
C. රෝහණය එක්සේසත් කිරීම.
D. මාමාවරු විසිදෙනෙකු ඝාතනය කිරීම.

29. පිරිවෙන යනු,

A. භික්ෂුණීන් වහන්සේගේ වාසය සඳහා ඉදි වූ කුටිය යි.
B. භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන මධ්‍යස්ථානය යි.
C. භික්ෂූන් වහන්සේලා ධර්මය පුගුණ කරන ස්ථානය යි.
D. භික්ෂූන් වහන්සේලාගේ පොහොය කර්ම කරන ස්ථානය යි.

30. වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගෙන් පිරිවෙන් අධ්‍යාපනයට සිදු වූ සේවාව,

A. ගණින්නාන්සේලා අධ්‍යාපනය භාරව කටයුතු කිරීම.
B. නියමකන්ද විහාරයේ ද මුල් ම පිරිවෙන ආරම්භ කිරීම.
C. භික්ෂූන් අඹු දරුවන් පෝෂණය කරමින් දේපල භුක්ති විඳීම.
D. සිටිනාමළුවේ ධම්මජෝති හිමියන් ශ්‍රී පාදස්ථානාධිපති ව කටයුතු කරමින් රුහුණු ප්‍රදේශයෙහි ධර්ම ශාස්ත්‍රාලෝකය පැතිර වීම.

➢ **අංක 31 සිට 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා | A. විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීම. |
| 2. රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි | B. පරම විඥානාර්ථ සමාගම |
| 3. අනගරික ධර්මපාලතුමා | C. මහා බෝධි සමාගම |
| 4. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | D. විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීම. |

(1) A , B , C , D (2) B , A , C , D (3) B , A , D , C (4) A , C , B , D

32.

| X | Y |
|---|---|
| 1. පානදුරා වාදය | A. 1873 |
| 2. උදම්මිට වාදය | B. 1865 |
| 3. බද්දේගම වාදය | C. 1866 |
| 4. වරාගොඩ වාදය | D. 1864 |

(1) A , B , C , D (2) B , A , D, C (3) A , C , D , B (4) A , C , B , D

33.

| X | Y |
|---|---|
| 1. උපෝසථාගාරය | A. බුද්ධ ප්‍රතිමාවේ ආරක්ෂාව |
| 2. බෝධිඝරය | B. ස්තූපවල ආරක්ෂාව |
| 3. චෛතියඝරය | C. විනය කර්ම සිදු කිරීම |
| 4. පටිමාඝරය | D. බෝධීන් වහන්සේගේ ආරක්ෂාව |

(1) A , B , C , D (2) C , D , B , A (3) B , C , D , A (4) D , A , C , B

34. X | Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | සූරතිස්ස රාජ්‍ය සමය | A. | සය ද්‍රවිඩ ආක්‍රමණය |
| 2. | අසේල රාජ්‍ය සමය | B. | සේන ගුත්තික ආක්‍රමණය |
| 3. | වළගම්බා රාජ්‍ය සමය | C. | එළාර ආක්‍රමණය |
| 4. | මිත්තසේන රාජ්‍ය සමය | D. | ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණය |

(1) A , B , C , D (2) B , C , D , A (3) C , A , B , D (4) D , A , B , C

35.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බුද්ධඝෝෂ හිමි | A. | මහාවංස කතුවරයා |
| 2. | මහානාම හිමි | B. | දේශාටන භික්ෂුවකි. |
| 3. | පාහියන් හිමි | C. | මහායාන භික්ෂුවකි. |
| 4. | සංඝමිත්‍ර හිමි | D. | අටුවාචාර්ය භික්ෂුවකි. |

(1) A , B , C , D (2) B , A , D , C (3) C , D , B , A (4) D , A , B , C

➢ **අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | ඉතිහාසය යනු මානව ශිෂ්ටාචාරයේ ආරම්භය, විකාශය හා සංවර්ධනය විස්තර වෙන කතා පුවතකි. | ඉතිහාසය අතීතය හා වර්තමානය අතර සංවාදයකි. |
| 37. | ආදි මානවයාගේ වාසස්ථාන ලෙස ස්වාභාවික ගල් ගුහා භාවිත විය. | ආදී මානවයාගේ ගල් ගුහාවල කුඩා පවුල් දහයක් හෝ දොළහක් ජීවත් වන්නට ඇතැ යි සැලකේ. |
| 38. | වසභ රජතුමා මෞර්ය වංශයේ ආරම්භක රජු ය. | කුඩා වැව් ඉදි කිරීමේ පළමු පියවර තැබුවේ වසභ රජතුමා ය. |
| 39. | ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා ය. | ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ඇසුරින් නිර්මාණය වූ ජාතික කොඩිය සිංහ කොඩිය ලෙස ද හැඳින්වේ. |
| 40. | ජාතික ගීයේ නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතා ය. | රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ එස්.එම්.සෙනෙවිරත්න නම් චිත්‍ර ශිල්පියා විසිනි. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I I |
|---|---|---|

පැය දෙකයි.

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024
## 3 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - II පත්‍රය

සැ.යු.

- ❖ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- ❖ **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර, නම් කරන්න.

1. අනුරාධපුර 2. ත්‍රිකුණාමලය 3. පොලොන්නරුව
4. සෙංකඩගල 5. මහියංගනය 6. මැණික් ගඟ

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු $1 \times 6 = 06$)

II. (අ) A රූපයේ දැක්වෙන ස්තූපය කුමක් ද?

(ආ) මෙම නිර්මාණය කර වූ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක් ද?

(ලකුණු 03)



A රූපය

III. (අ) B රූපයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

(ආ) එය කුමන රජුගේ පාලන කාලයට අයත් වේ ද?

(ඉ) මෙය කුමන රාජධානි සමයට අයත් ගොඩනැගිල්ලක් ද?

(ලකුණු 03)



B රූපය

02. I. ඉතිහාසය හැදෑරීමට ඇති සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ලක්දිවට පැමිණි ප්‍රධාන භාරතීය ජන කණ්ඩායම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. පණ්ඩුකාභය රජතුමාගෙන් නාගරික සංවර්ධනයට සිදු වූ සේවාව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර විධි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ආදි මානවයා භාවිත කළ ගල් මෙවලම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. ලංකාවට පැමිණි භාරතීය ජන කණ්ඩායම් ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගැනීමට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. I. මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුගේ බුද්ධිය පරීක්ෂා කර බැලීම සඳහා අසන ලද ප්‍රශ්න දෙක නම් කරන්න. (ලකුණු 02)

II. දේවානම්පියතිස්ස රජතුමා සිදු කළ ආගමික සේවා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. මහින්දාගමනයෙන් පසුව මෙරට ආගමික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් පහදන්න. (ලකුණු 06)

05. I. අනුරාධපුර යුගයේ පැවැති ප්‍රධාන වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මිත්සෙන් රජු දවස දකුණු ඉන්දියාවෙන් පැමිණි ෂඩ් ආක්‍රමණිකයන්ගෙන් සිව් දෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 04)

III. ධාතුසේන රජතුමා ආර්ථික වශයෙන් සිදු කළ සේවය කරුණු තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

06. I. ලෝකයේ බිහි වූ මුල් ම විශ්වවිද්‍යාල අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. අනුරාධපුර යුගයේ පැවති පිරිවෙන් ආයතන හතරක් දක්වන්න. (ලකුණු 04)

III. කෝට්ටේ යුගය පිරිවෙන් අධ්‍යාපනයේ ස්වර්ණමය යුගයක් ලෙස සඳහන් කිරීමට හේතු වූ සාධක තුනක් පහදන්න. (ලකුණු 06)

07. I. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. පහත (a) හා (b) වලට සම්බන්ධ දෙදෙනා දක්වන්න.
   (a). වැලිවිට සරණංකර හිමි වැඩ සිටි සමයේ රජතුමා
   (b). සියම් රටෙන් උපසම්පදාව ගෙන ආ භික්ෂුව (ලකුණු 04)

III. කෝට්ටේ යුගයෙන් පසු පිරිවෙන් අධ්‍යාපනය බිඳ වැටීමට හේතු වූ කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   I. වසභ රජුගේ ආර්ථික ප්‍රතිපත්තිය
   II. මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද
   III. පණ්ඩුකාභය රජතුමාගේ ළමා කාලය
   IV. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් ව පිහිටීම නිසා ඇති වූ බලපෑම

(ලකුණු $6 \times 2 = 12$)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන අංශය -/Ministry of Education - of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024

## 3 ශ්‍රේණිය


| 07 | S | II |
|---|---|---|

පැය දෙකයි.

## (07) ඉතිහාසය - II පත්‍රය

සැලකිය යුතුයි :

- දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා බාර දෙන්න.



# ඉතිහාසය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



www.pirivena.lk

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven End Year Term Test - 2018

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය **I, II** කාලය : පැය තුන යි

**History I, II** **Time : Three Hours**

**ඉතිහාසය I**

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.)

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

**අංක 01 සිට අංක 15 තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

01. "අතීත සිද්ධීන් පිළිබඳ දැනුම වනාහී මනුෂ්‍ය ස්වාභාවය නිවැරදි කිරීම සඳහා ප්‍රබලතම උපකරණය වෙයි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා වන්නේ,

i. ඊ. එච්. කාර් ය. ii. පොලිබියස් ය.

iii. ඩියෝඩරස් ය. iv. ශ්‍රී ජවහර්ලාල් නේරු ය.

02. කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රදේශයේ ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථානය කුමක් ද?

i. බෙලිලෙන ii. බටදොඹලෙන

iii. පාහියන්ගල්ලෙන iv. අළුලෙන

03. රත්නපුර දිස්ත්‍රික්කයේ බටදොඹලෙන ආශ්‍රිත ව කළ කැනීම්වලින් හමු වූ මිනිස් හකු ඇටයට අනුව ඔහු ජීවත් වූ කාලය ලෙස සැලකෙන්නේ,

i. වසර 31000 කට පෙර ය. ii. වසර 25000 කට පෙර ය.

iii. වසර 32000 කට පෙර ය. iv. වසර 28000 කට පෙර ය.

04. බලංගොඩ ප්‍රදේශයෙන් හමුවී ඇති, ආදි මානවයා භාවිත කළ ගල් මෙවලම් ප්‍රමාණයෙන්,

i. සෙ.මී.2ක් හා සෙ.මී.4.5ක් විශාල ය. ii. සෙ.මී.3ක් හා සෙ.මී.5.5ක් විශාල ය.

iii. සෙ.මී.2ක් හා සෙ.මී.4.6ක් විශාල ය. iv. සෙ.මී.2ක් හා සෙ.මී.4.7ක් විශාල ය.

05. ආදි මානවයා දියලුණු භාවිත කළ බවට තොරතුරු හමුවන්නේ කුමන ලෙනක් ආශ්‍රිත ව කළ කැණීම්වලින් ද?

i. පාහියන්ගල්ලෙන ii. බටදොඹලෙන

iii. බෙලිලෙන iv. අළුලෙන

06. ආදි මානවයා සුසාන භූමි සඳහා මැටි භාණ්ඩ යොදාගෙන ඇත. එසේ යොදා ගත් මැටි භාණ්ඩවලින් නිර්මාණාත්මක අගයක් ඇති මැටි භාණ්ඩ සොයාගෙන ඇති ස්ථානය කුමක් ද?

i.පොම්පරිප්පුව සුසාන භූමියෙන් ය
ii. ඉබ්බන්කටුව සුසාන භූමියෙන් ය
iii. පාහියන්ගල සුසාන භූමියෙන් ය
iv. ඉරණමඩුව සුසාන භූමියෙන් ය

07. ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දුර ප්‍රමාණය කොපමණ ද?

i. කිලෝ මීටර් 453
ii. කිලෝ මීටර් 432
iii. කිලෝ මීටර් 435
iv. කිලෝ මීටර් 433

08. පෘතුගීසීන්ට විරුද්ධ ව සටන් කිරීමට දකුණු ඉන්දීය සැමොරින් නම් මුස්ලිම් ජාතිකයාගේ සහය ලබාගත් රජතුමා කවුද?

i. පළමුවන මුගලන් රජතුමා ය
ii. තුන්වන දෙටුතිස් රජුතුමා ය
iii. සීතාවක මායාදුන්නේ රජතුමා ය
iv. පළමුවන විජයබාහු රජතුමා ය

09. ශ්‍රී ලංකාවේ ප්‍රාචීන භාෂෝපකාර සමාගම පිහිට වූ වර්ෂය කුමක් ද?

i. ක්‍රි. ව. 1905
ii. ක්‍රි. ව. 1908
iii. ක්‍රි. ව. 1904
iv. ක්‍රි. ව. 1902

10. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

i. ඕළු මල ය
ii. නිල් මානෙල් මල ය
iii. නෙළුම් මල ය
iv. අරලිය මල ය

11. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය පදනම් කර ගෙන ඉන්දියාවේ බිහි වූ විශ්වවිද්‍යාලයක් වන්නේ,

i. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය යි.
ii. කල්කටා විශ්වවිද්‍යාලය යි.
iii. නාලන්දා විශ්වවිද්‍යාලය යි.
iv. බාරාණසී විශ්වවිද්‍යාලය යි.

12. වැලිවිට සංඝරාජ හිමිපාණන් වහන්සේ පැවිදිබිමට පත්වනු ලබන්නේ,

i. කොරතොට විහාරයේ දී ය.
ii. අභයගිරි විහාරයේ දී ය.
iii. මල්වතු මහා විහාරයේ දී ය.
iv. සූරියගොඩ විහාරයේ දී ය.

13. පූර්ව ශිලා යුගය ලෙස හඳුන්වනු ලබන්නේ,

i. ගොවි යුගයය යි.
ii.දඩයම් යුගය යි.
iii. එඬේර යුගය යි.
iv. මධ්‍යතන යුගය යි.

14. බැබිලෝනියානු නගරයේ අගනුවර තුළ පමණක් ඇති දේවස්ථාන ප්‍රමාණය වන්නේ,

i. දේවාල 53ක් ය.
ii. දේවාල 63ක් ය.
iii. දේවාල 83ක් ය.
iv. දේවාල 13ක් ය.

15. කඩදාසි භාවිතය මුලින් ම සිදුකළ ශිෂ්ටාචාර වැසියන් වන්නේ,

i. චීන වැසියන් ය.
ii. මිසර වැසියන් ය.
iii. ඉන්දු නිම්න වැසියන් ය.
iv. නයිල් නිම්න වැසියන් ය.

**අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

16.

i. රුවන්වැලි මහා සෑය

ii. මිරිස වැටිය.

iii. ලෝවාමහාපාය.

iv. අභයගිරිය.

17.

i. ජේතවනාරාම පිරිවෙණ.

ii. ආළාහන පිරිවෙණ.

iii. මහින්ද සේල පිරිවෙණ.

iv. උත්තරෝල්හ පිරිවෙණ.

18.

i. වලානේ සිද්ධාර්ථ හිමි

ii. ඉඳුරුවේ සුමංගල හිමි

iii. මාදුළුවාවේ සෝභිත හිමි

iv. වස්කඩුවේ සුභූති හිමි

19.

i. ධර්මචක්‍රය

ii. නා ගස

iii. පුන්කලස

iv. වී කරල්

20.

i. කම්කරු යුගය

ii. දඩයම් යුගය

iii. එඬේර යුගය

iv. ගොවි යුගය

**අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21.

i. අළුලෙන - කෑගල්ල

ii. බෙල්ලන්බැඳිපැලැස්ස - බලංගොඩ

iii. බටදොඹලෙන - රත්නපුර

iv. බෙලිලෙන - කළුතර

22.

i. විජයබා පිරිවෙණ - තොටගමුව

ii. ඉරුගල්කුලතිලක පිරිවෙණ - දෙවිනුවර

iii. පරාක්‍රමබාහු පිරිවෙණ - කුරුණෑගල

iv. සුනේත්‍රාදේවි පිරිවෙණ - පැපිලියාන

23.

i. බද්දේගම වාදය - ක්‍රි.ව. 1864

ii. උදම්විට වාදය - ක්‍රි.ව. 1866

iii. වරාගොඩ වාදය - ක්‍රි.ව. 1863

iv. ගම්පොල වාදය - ක්‍රි.ව. 1871

24.

i. ශ්‍රී ලංකා ජාතික කොඩියේ රතුපාට පසුබිමෙන් - අභිමානය පෙන්නුම් කරයි

ii. ශ්‍රී ලංකා ජාතික කොඩියේ තැඹිලි පාට පසුබිමෙන් - පිවිතුරු බව පෙන්නුම් කරයි

iii. ශ්‍රී ලංකා ජාතික කොඩියේ කොළ පාට පසුබිමෙන් - මුස්ලිම් ජනයා නියෝජනය කරයි

iv. ශ්‍රී ලංකා ජාතික කොඩියේ බෝපත් සතරින් - සතර බ්‍රහ්ම විහරණ පෙන්නුම් කරයි

25.

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය - යමුනා ගංගා නම්න

ii. මිසර ශිෂ්ටාචාරය - නයිල් නිම්නය

iii. මොහෙන්ජෝදාරෝ හරප්පා ශිෂ්ටාචාරය - ඉන්දු ගංගාව

iv. හොවැංහෝ ශිෂ්ටාචාරය - කහා ගඟ

**අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට දක්වා ඇති A, B, C, D යන ප්‍රකාශ හතර අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රකාශ දෙක සඳහන් පිළිතුර තෝරන්න.**

26. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කැණීම්වලින්,

A රත්නපුර ප්‍රදේශයේ කළ කැණීම්වලින් වඳුරන් ගේ උල් දත් හමු වී ඇත.

B බෙල්ලන්බැඳිපැලැස්සේ කළ කැණීම්වලින් මිනිස් ඇටකැබලි සොයාගෙන ඇත.

C රාවණාඇල්ල ගුහාවේ කළ කැණීම්වලින් හමු වූ මිනිස් හිස්කබල පහට බෙදා ඇත.

D පාහියන්ගල කැණීම්වලින් අදින් වසර 50000කට පෙර වාසය කළ මිනිසුන්ගේ ඇටකටු හමු වී ඇත.

i. A සහ B

ii. B සහ C

iii. A සහ D

iv. C සහ D

27. කෝට්ටේ යුගයේ සාහිත්‍යය,

A ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි

B බුදුගුණ අලංකාරය - වීදාගම මෛත්‍රීය හිමි

C ලොවැඩ සඟරාව - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

D ගිරා සන්දේශය - ධම්මදින්න විමලකිත්ති හිමි

i. A සහ B

ii. B සහ C

iii. C සහ D

iv. A සහ D

28. සෙංකඩගල රාජධානි සමයේ දී,

A ඇතැම් භික්ෂූහු අඹුදරුවන් පෝෂණය කළෝ ය.

B ගණින්නාන්සේලා නමින් භික්ෂූන් වහන්සේලා නොසිටියෝ ය.

C ඉතා හොඳින් සංඝ සමාජයට රාජ අනුග්‍රහය ලැබුණි.

D භික්ෂූන් වහන්සේලා ගිහියන් මෙන් කර්මාන්ත ආදියෙහි නිරතවූහ.

i. A සහ B

ii. B සහ C

iii. C සහ D

iv. A සහ D

29. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ නිර්මාතෘ කමිටුව,

A ඩී. බී. ජයතිලක මහතා

B මහාචාර්ය මැන්දිස් රෝහණධීර මහතා

C එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා

D ජේ. ආර්. ජයවර්ධන මහතා

i. A සහ B  ii. B සහ C

iii. C සහ D  iv. A සහ D

30. මිසර සංස්කෘතිය අංශ කිහිපයකින් යුක්තය,

A ආගමික විශ්වාස හා පුද පූජා නොතිබිණි

B දියුණු ගෘහ නිර්මණයක් පැවතිණි

C ලේඛනය හා සාහිත්‍ය දියුණුව පැවතිණි

D දියුණු කලාවක් නොතිබිණි

i. A සහ B  ii. B සහ C

iii. C සහ D  iv. A සහ D

**අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නයන්හි නාම ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. එම ප්‍රකාශන කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.**

31.

| X | Y |
| --- | --- |
| 01. ථූපාරාමය | A. දුටුගැමුණු රජතුමා |
| 02. අභයගිරිය | B. වලගම්බා රජතුමා |
| 03. ලෝවාමහාපාය | C. ධාතුසේන රජතුමා |
| 04. අවුකන පිළිමය | D. දේවානම්පියතිස්ස රජතුමා |

i. B,A,D,C  ii. D,B,A,C

iii. A,B,D,C  iv. A,C,B,D

32.

| X | Y |
| --- | --- |
| 01. අමාවතුර | A. අනුරාධපුර යුගය |
| 02. සිංහල ජාතක පොත | B. කුරුණෑගල යුගය |
| 03. පැරකුම්බා සිරිත | C. පොළොන්නරු යුගය |
| 04. සියබස්ලකර | D. කෝට්ටේ යුගය |

i. C,B,D,A  ii. D,B,AC

iii. A,B,D,C  iv. A,C,B,D

www.pirivena.lk

33. X | Y

01. පරම විඥානාර්ථ සමාගම — A. අනගාරික ධර්මපාලතුමා

02. විද්‍යාලංකාර පිරිවෙණ — B. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

03. විද්‍යෝදය පිරිවෙණ — C. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි

04. මහාබෝධි සමාගම — D. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

i. BADC　　ii. DBAC

iii. DCBA　　iv. ACBD

34. X | Y

01. 1948 ජනවාරි 31 — A. වර්තමාන ජාතික ගීයට කැබිනට් අනුමැතිය ලැබීම.

02. 1948 පෙබරවාරි 04 — B. පළමු නිදහස් දින සැමරුම.

03. 1951 නොවැම්බර් 22 — C. රාජ්‍ය ලාංඡනය ආදේශ වීම.

04. 1972 මැයි 22 — D. ජාතික ගී තරගය

i. BADC　　ii. DBAC

iii. ABDC　　iv. ACBD

35. X | Y

01. උබයිඩ් අවදිය — A. ක්‍රි. පූ. 2350 2150

02. උරුක් අවදිය — B. ක්‍රි. පූ. 4000 3000

03. පුරාණ රාජවංශ අවදිය — C. ක්‍රි. පූ. 3000 2350

04. අක්කඩ් අවදිය — D. ක්‍රි. පූ. 5000 4000

i. BADC　　ii. DBAC

iii. ABDC　　iv. DBCA

**අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශය දැයි තෝරා ගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

| අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| i. | නිවැරදිය | නිවැරදිය |
| ii. | නිවැරදිය | වැරදිය |
| iii. | වැරදිය | වැරදිය |
| iv. | වැරදිය | නිවැරදිය |

| | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36. | පණ්ඩුකාභය කුමරුගේ මව උන්මාද චිත්‍රා ය | පණ්ඩුල බ්‍රාහ්මණයා වේද ශාස්ත්‍රයෙහි පරතෙරට පත් අයෙකි. |
| 37. | මහාවිහාරය ථේරවාදී බෞද්ධ අධ්‍යාපන ආයතනයකි. | බූත්සරණ අනුරාධපුර යුගයේ දී රචනා කර ඇත. |
| 38. | ජාතික කොඩියේ තැඹිළි පාට තීරුවෙන් මුස්ලිම් ජනයා නියෝජනය කරයි. | ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ක්‍රිකට් ක්‍රීඩාව යි. |
| 39. | සාරාර්ථ සංග්‍රහය වැලිවිට සංඝරාජ හිමියන්ගේ කෘතියකි. | අධ්‍යාපන කොමිෂන් සභාව ක්‍රි.ව. 1867 පිහිටුවන ලදි. |
| 40. | ලිවීම සඳහා පැපිරස් පත්‍ර භාවිත කරන ලද්දේ ඉන්දු නිම්න වැසියන් ය. | හමුරාබි රජුගේ නීති සංග්‍රහය මෙසපොතේමියාවෙන් හමු වී ඇත. |

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Tearm Test - 2018

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ඉතිහාසය I, II**
**History I, II**

**ඉතිහාසය II**

**සැලකිය යුතුයි :**

i. පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
ii. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
iii. මෙම කොටසට මුළු ලකුණු 60 ක් හිමි වේ.

---

01.

i. ඔබට සපායා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණුකර නම් කරන්න.

(1). දෙවුන්දර තුඩුව (2). මහවැලි ගඟ (3). කුරුණෑගල (4). තිස්සමහාරාමය

(5). ත්‍රිකුණාමල වරාය (6). විජිතගාම (ලකුණු 06)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

(අ). මෙම රූපයේ දක්වෙන ස්තූපය කුමක් ද?

(ආ). එය කර වූ රජතුමා කවුරුන් ද?

(ඉ). මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

(ලකුණු 03)



B රූපය

(අ). මෙම රූපයේ දක්වෙන්නේ කුමක් ද?

(ආ). එය කර වූ රජතුමා කවුරුන් ද?

(ඉ). මෙය පිහිටා ඇති රට කුමක් ද?

(ලකුණු 03)

02. " භාරතීය ජනයා ශ්‍රී ලංකාවට සංක්‍රමණය වීම නිසා මෙරට ජනාවාස ව්‍යාප්තිය සිදුවිය. "

i. ලක්දිවට පැමිණි භාරතීය ජන සංක්‍රමණ පිළිබඳව තොරතුරු දක්වෙන දේශීය මූලාශ්‍රය දෙකක් නම් කරන්න.

ii. මෙරටට සංක්‍රමණය වූ භාරතීය ජන කණ්ඩායම් හතරක් නම් කරන්න.

iii. ආර්යයන් ගංගා ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගැනීමට හේතුව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

03. "වලගම්බා රජු දවස ත්‍රිපිටකය පොත්පත්වල ලිවීම නිසා බෞද්ධ අධ්‍යාපන ක්‍රමය සුරක්ෂිත විය."

i. අනුරාධපුර යුගයේ දී රචනා වූ කෘති දෙකක නම් ලියන්න.

ii. කෝට්ටේ යුගයේ ප්‍රසිද්ධ පිරිවෙන් හතරක නම් ලියන්න.

iii. ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ දියුණුව සිදු වූ අයුරු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

04. "පළමුවරට ලක්දිව එක්සේසත් කළ දුටුගැමුණු මහ රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකි."

i. දුටුගැමුණු මහ රජතුමාගේ මවගේ සහ පියාණන්ගේ නම් ලියන්න.

ii. දුටුගැමුණු මහ රජතුමාට පෙර ලක්දිව රජකම් කළ රජවරුන් හතර දෙදෙනෙකුගේ නම් ලියන්න.

iii. දුටුගැමුණු මහ රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

05.

i. මහනුවර යුගයේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය දියුණුව පැවති බව සාධක දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම වීම නිසා මෙරට බෞද්ධ අධ්‍යාපන ක්‍රමය දියුණු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6 + 6 = 12)

06.

i. මිනිසා ශිෂ්ටාචාර ගතවීමට පෙර ජීවත් වූ යුග තුන පිළිබඳව පැහැදිලි කරන්න.

ii. ආදි මනවයාගේ ආහාර භාවිතය පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 6 = 12)

07.

i. මිසර ශිෂ්ටාචාරයේ සමෘද්ධිමත් යුග තුන වර්ෂයන් සමග ලියන්න.

ii. "මිසර වැසියෝ මරණින් මතු ජිවිතයක් ගැන විශ්වාස කළෝය." මෙය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6 + 6 = 12)

08. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව ඓතිහාසික තොරතුරු කෙටියෙන් ලියන්න.

i. වසභ රජුගේ රාජ්‍ය පාලනය.

ii. කෝට්ටේ යුගයේ පද්‍ය සාහිත්‍යයේ දියුණුව.

iii. ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය.

iv. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය (ලකුණු 6 + 6 = 12)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## ඉතිහාසය



# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2019

## Primary Piriven Mid Year Tearm Test - 2019

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

කාලය : පැය තුන යි
**Time : Three Hours**

### ඉතිහාසය I

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 01 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. (ලකුණු 1 × 40 × 40)

01. "වර්තමානය අරබයා අත්හදා බැලීම් කරනවාට වඩා අතීතයේ ජයග්‍රහණ අනුගමනය කරන්නට ලැබීම භාග්‍යයකි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා වන්නේ,

i. පොලිබියස් ය.   ii. ඊ. එච්. කාර් ය   iii. ශ්‍රී ජවහර්ලාල් නේරු ය   iv. ඩියෝඩරස් ය

02. කෑගලු දිස්ත්‍රික්කයේ අත්තනගොඩ ප්‍රදේශයේ ඇති ප්‍රාග් ඓතිහාසික ස්ථානයන් මේ අතරින් කුමක්ද?

i. අළුලෙන, බටදොඹලෙන   ii. අළුලෙන, පාහියන්ගලලෙන

iii. අළුලෙන, බෙලිලෙන   iv. අළුලෙන, රාවනා ඇල්ල

03. කලුතර දිස්ත්‍රික්කයේ පාහියන්ගලලෙන ආශ්‍රිතව කළ කැණීම්වලින් හමු වූ මිනිස් ඇටසැකිලි.

i. වර්ෂ 35000ට වඩා පැරණිය.   ii. වර්ෂ 25000ට වඩා පැරණිය.

iii. වර්ෂ 28000ට වඩා පැරණිය.   iv. වර්ෂ 31000ට වඩා පැරණිය

04. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කුඩා ලිප් කැණීම්වලින් සොයාගත්තේ,

i. කිතුල්ගල කැණීම්වලින්ය.   ii. බටදඹලෙන කැණීම්වලින්ය.

iii. ඉබ්බණාටුව කැණීම්වලින්ය.   iv. පාහියන්ගල කැණීම්වලින්ය.

05. ආදි මානවයා ගේ ප්‍රධාන ජීවනෝපාය බවට පත් වූයේ ?

i. ගොවිතැන ය.   ii. හේන් ගොවිතැන ය.

iii. දඩයම් කිරීම ය.   iv. සතුන් හීලෑ කරගැනීම ය..

06. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි විශාල ප්‍රමාණයක් පොම්පරිප්පුව, ඉබ්බන්කටුව වැනි ප්‍රදේශවලින් හමු වී ඇත ?

i. එසේ හමු වූ සුසාන භූමි ප්‍රමාණය 40 කි.

ii. එසේ හමු වූ සුසාන භූමි ප්‍රමාණය 30 කි.

iii. එසේ හමු වූ සුසාන භූමි ප්‍රමාණය 60 කි.

iv. එසේ හමු වූ සුසාන භූමි ප්‍රමාණය 20 කි.


www.pirivena.lk

07. ශ්‍රී ලංකාවේ ඉන්දියන් සාගරයෙන් වෙන් වන්නේ ඉතා පටු මුහුදු තීරයකිනි. එහි දුර ප්‍රමාණය කොපමණ ද?

i. කිලෝ මීටර් 25 කි.
ii. කිලෝ මීටර් 32 කි.
iii. කිලෝ මීටර් 43 කි.
iv. කිලෝ මීටර් 50 කි.

08. පරාක්‍රම බාහු රජතුමාගේ පාණ්ඩ්‍ය වංශික අගමෙහෙසි බවට පත් වූයේ කවුරුන් ද?

i. ලීලාවතී බිසව ය.
ii. පද්මාවතී බිසව ය.
iii. කළ්‍යාණවතී බිසව ය.
iv. අමරාවතී බිසව ය.

09. වැලිවිට සරණංකර සංඝරාජ හාමුදුරුවන් වහන්සේ ගේ උපත සිදු වූ වර්ෂය කුමක් ද?

i. ක්‍රි. ව. 1869 ය.
ii. ක්‍රි. ව. 1789 ය.
iii. ක්‍රි. ව. 1796 ය.
iv. ක්‍රි. ව. 1689 ය.

10. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,

i. හංසයා ය.
ii. වලි කුකුළා ය.
iii. මොනරා ය.
iv. කොවුලා ය.

11. බෞද්ධ අධ්‍යාපනය මුල්කරගෙන ලෝකයේ බිහි වූ මුල්ම විශ්ව විද්‍යාලයක් ලෙස සලකනු ලබන්නේ,

i. කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය යි.
ii. කල්කටා විශ්ව විද්‍යාලය යි.
iii. නාලන්දා විශ්ව විද්‍යාලය යි.
iv. බාරාණසී විශ්ව විද්‍යාලය යි.

12. වැලිවිට සංඝරාජ හිමිපාණන් වහන්සේ විසින් රචිත කෘතියක් වන්නේ,

i. බුදුගුණ අලංකාරය ය
ii. ලෝවැඩ සඟරාව ය.
iii. සිරිත් මල්දම ය.
iv. සාරාර්ථ සංග්‍රහය ය.

13. වයඹදිග ඉන්දියාවේ ඉන්දු ගංගාව කේන්ද්‍ර කරගෙන බිහි වූ ශිෂ්ටාචාරය ලෙස හඳුන්වනු ලබන්නේ,

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය යි.
ii. මොහෙන්ජෝදාරෝ හරප්පා ශිෂ්ටාචාරය යි.
iii. මිසර ශිෂ්ටාචාරය යි.
iv. හොවැංහෝ ශිෂ්ටාචාරය යි.

14. විද්වතුන් දක්වන ආකාරයට ලෝකයේ පැරණිතම නාගරික ශිෂ්ටාචාරය වන්නේ,

i. සුමේරියානු ශිෂ්ටාචාරය යි.
ii. බැබිලෝනියානු ශිෂ්ටාචාරය යි.
iii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය යි.
iv. මිසර ශිෂ්ටාචාරය ය

15. ලොව පැරණිතම නීති සංග්‍රහය ලෙස සලකනු ලබන්නේ,

i. හමුරාබි රජු ගේ නීති සංග්‍රහය යි.
ii. අශෝක රජු ගේ නීති සංග්‍රහය යි.
iii. දුටුගැමුණු රජු ගේ නීති සංග්‍රහය යි.
iv. ඇලෙක්සැන්ඩර් රජු ගේ නීති සංග්‍රහය යි.


www.pirivena.lk

- අංක16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

16. i. දක්ඛිණ විහාරය | ii. සාලිය විහාරය | iii. පබ්බතාරාමය | iv. ඉසුරුමුණි විහාරය

17. i. දෙවුන්දර නන්දන පිරිවෙන | ii. කුරුණෑගල මහේන්ද්‍ර පිරිවෙන | iii. මහනුවර සරණංකර පිරිවෙන | iv. අනුරාධපුර භුවනෙකබාහු පිරිවෙන

18. i. බද්දේගම වාදය | ii. උදම්විට වාදය | iii. පොරුපනවාදය | iv. වරාගොඩ වාදය

19. i. ජාතික කොඩිය | ii. බෞද්ධාගම | iii. ජාතික ගීය | iv. ජාතික වෘක්ෂය

20. i. ශිෂ්ටාචාර යුගය | ii. පූර්ව ශිලා යුගය | iii. මධ්‍යය ශිලා යුගය | iv. නව ශිලා යුගය

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

21. i. රාම ගෝණය මහවැලි ගං මෝය අසල | ii. විජිත ගාම මහවැලි ගං මෝය අසල | iii. දීඝායු ගාම වර්තමාන ගල්ඔය අසල | iv. උරුවෙල ගාම කලා ඔය අසල

22. i. සියබස්ලකර - අනුරාධපුර යුගය | ii. බුත්සරණ - පොළොන්නරු යුගය | iii. අමාවතුර - අනුරාධපුර යුගය | iv. සිංහල ජාතක පොත - කුරුණෑගල යුගය

23. i. හික්කඩුවේ සුමංගල හිමි - විද්‍යෝදය පිරිවෙන
ii. රත්මලානේ ධම්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙන
iii. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා - මහාබෝධි සමාගම
iv. අනගාරික ධර්මපාල තුමා - මහාබෝධි සමාගම

24. i. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ධර්ම චක්‍රයෙන් - ධාර්මිකභාවය පෙන්නුම් කරයි
ii. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ වී කරල්වලින් - පිවිතුරු බව පෙන්නුම් කරයි
iii. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ පුන්කළසින් - සමෘද්ධිමත්බව පෙන්නුම් කරයි
iv. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ඉර සහ සඳ - සදාකාලික පැවැත්ම පෙන්නුම් කරයි


www.pirivena.lk

25. i. මාලිමා යන්ත්‍රය සොයා ගැනීම - මිසර ශිෂ්ටාචාරය

ii. ලෝක ප්‍රකට පිරමිඩ - නයිල් නිම්න ශිෂ්ටාචාරය

iii. ලොව පුදුම හතෙන් එකක්වන එල්ලෙන උද්‍යානය - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

iv. ලිංග හා යෝනි වන්දනාව - ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරැදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරාන්න.

26. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කැණිම්වලින්,

A. ඔස්ට්‍රොලොයිඩ් මානව වර්ගයාට අයත් යැයි විශ්වාස කෙරෙන මානව අස්ථි හමු වී ඇත.

B. පාහියංගලින් හමු වූ මිනිස් ඇටසැකිලි අදින් වසර 5000කට වඩා පැරණි බව සොයාගෙන ඇත.

C. බෙලිලෙන කැණිම්වලින් කුරුඳු පොතු ආහාරයට ගත්බව සොයාගෙන ඇත.

D. බටදොඹ ලෙන ආශ්‍රිතව අදින් වසර 28000කට පෙර වාසය කළ මිනිසෙකුගේ ඇටයක් හමු වී ඇත.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

27. එක් එක් යුගවල බිහි වූ සාහිත්‍ය කෘති අතර,

A. පොළොන්නරු යුගය - වංසත්ථප්පකාසිනී

B. අනුරාධපුර යුගය - රසවාහිණිය

C. කුරුණෑගල යුගය - සිංහල ජාතක පොත

D. දඹදෙණි යුගය - පූජාවලිය

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

28. පොළොන්නරු රාජධානි සමයේ දී,

A. සියලු භික්ෂූන් උපාධ්‍යායන් යටතේ වසර දහයක් අධ්‍යාපනය ලැබීය.

B. නවක භික්ෂූන් උපාධ්‍යායන් යටතේ වසර පහක් අධ්‍යාපනය ලැබීය.

C. මධ්‍යම භික්ෂූන් උපසම්පදාවෙන් වසර 5ට පසු ගුරු නිශ්‍රයෙන් මිදේ.

D. ස්ථවිර භික්ෂු තත්වය ලැබෙන්නේ වසර පහළොවකට පසුවය.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D

29. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ,

A. තැඹිලිපාට තීරුවෙන් - දෙමළ ජනයා නියෝජනය වේ.

B. කොළපාට තීරුවෙන් - මුස්ලිම් ජනයා නියෝජනය වේ.

C. කඩුව අතින් ගත් සිංහයාගෙන් - සියලු ජාතීන් නියෝජනය වේ.

D. බෝපත් සතරින් - සියලු ආගම් නියෝජනය වේ.

i. A සහ B ii. B සහ C iii. C සහ D iv. A සහ D


www.pirivena.lk

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2019

## Primary Piriven Year End Term Test - 2019

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඉතිහාසය I, II
History I, II

ඉතිහාසය II

සැලකිය යුතුයි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01.

i ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණුකර නම් කරන්න.

1. මාතොට　　2. පේදුරු තුඩුව　　3. කොළඹ

4. බූන්දල　　5. පිදුරන්ගල　　6. රාවණාඇල්ල

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

ii. පහත දී ඇති රූපසටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මෙම රූපයේ දක්වෙන ස්ථූපය කුමක් ද?

(ආ) එය කර වූ රජතුමා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

(ලකුණු 1 × 3 = 3)



A රූපය

iii.

(අ) මෙම රූපයේ දක්වෙන්නේ කුමක් ද?

(ආ) එය කර වූ පාලකයා කවුරුන් ද?

(ඉ) මෙය පිහිටා ඇති රට කුමක් ද?

(ලකුණු 1 × 3 = 3)



B රූපය

www.pirivena.lk

02. "මහින්දාගමනය නිසා ලක්දිව සංස්කෘතික ප්‍රබෝධයක් ඇතිවිය."

i ලක්දිවට මිහිඳු හිමියන් වැඩවීම පිළිබඳව තොරතුරු දක්වෙන දේශීය සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

ii මෙරටට මිහිඳු හිමියන් සමග වැඩම කරන ලද කණ්ඩායමේ හතර දෙනෙකු නම් කරන්න .

iii මහින්දාගමනය නිසා මෙරට සංස්කෘතියේ ඇති වූ වෙනස කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

03. "අනුරාධපුර යුගයට වඩා පසුකාලීන යුගවල දී අධ්‍යාපන ක්‍රමයේ දියුණුවක් සිදු විය."

i පොළොන්නරු යුගයේ දී රචනා වූ කෘති දෙකක නම් ලියන්න.

ii පොළොන්නරු යුගයේ ප්‍රසිද්ධ වූ මූලායතන හතරක නම් ලියන්න.

iii කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය දියුණු වූ අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

04. "දුෂ්කරතා මධ්‍යයේ ලක්දිව එක්සේසත් කළ වලගම්බා මහ රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකි."

i වළගම්බා මහ රජතුමා වනගතව සිටි කාලයේ දී සහාය දක් වූ දෙනෙකුගේ නම් ලියන්න.

ii වළගම්බා මහ රජතුමාට පෙර ලක්දිව රජකම් කළ රජවරුන් හතර දෙනෙකුගේ නම් ලියන්න.

iii වළගම්බා මහ රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 4 + 6 = 12)

05.

i වැලිවිට සංඝරාජ සරණංකර හිමිපාණන් වහන්සේගෙන් පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුවට සිදු වූ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii සංඝමිත්තා තෙරණිය ලක්දිවට වැඩම වීම නිසා මෙරට ජන සමාජයේ දියුණුවක් සිදු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 6 = 12)

06.

i මානවයා ශිෂ්ටාචාර ගතවීමට පෙර ඔවුන් ජීවත් වූ යුග තුන පිළිබඳ ව පැහැදිලි කරන්න.

ii මනවයා ගේ ජීවන රටාව පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 6 = 12)

)7.

i හමුරාබි රජු ගේ නීති සංග්‍රහය ගැන පැහැදිලි කිරීමක් කරන්න.

ii බැබිලෝනියානු සමාජය බෙදී ගිය කොටස් තුන පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 6 + 6 = 12)


www.piriyena.lk

08. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික තොරතුරු ලියන්න.

(i) ධාතුසේන රජුගේ රාජ්‍ය පාලනය.

(ii) දඹදෙණි යුගයේ ගද්‍ය සාහිත්‍යයේ දියුණුව.

(iii) ශ්‍රී ලංකාවේ ජාතික ගීය.

(iv) හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරය. (ලකුණු 6 + 6 = 12)


www.pirivena.lk

සියලු ම හිමිකම් ඇවිරිණි

All Rights Reserved

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020

# Primary Piriven Year End Test - 2020

## 03 ශ්‍රේණිය/Grade 03

ඉතිහාසය I, II  
History I, II

කාලය : පැය තුන යි  
Time : Three Hours

### ඉතිහාසය I

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. ඉතිහාසය එක් විෂයයක් නො විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය යි." මෙම නිර්වචනය ඉදිරිපත් කළ ඉතිහාසඥයා වන්නේ,

1. ඊ. එච්. කාර් ය.
2. ජී. එච්. ට්‍රෙවිලියන් ය
3. ඩියෝඩරස් ය.
4. ශ්‍රී ජවහර්ලාල් නේරු ය.

02. බටදොඹලෙන ආශ්‍රිත ව මිනිසෙකුගේ හකු ඇටයක් හමු වී ඇත. එය අයත් වන කාලය ලෙස සැලකිය හැකි පිළිතුර තෝරන්න.

1. වසර 28000කට පෙර
2. වසර 26000කට පෙර
3. වසර 20000කට පෙර
4. වසර 30000කට පෙර

03. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි 30කට ආසන්න සංඛ්‍යාවක් සොයාගෙන ඇත. එය පිහිටා ඇත්තේ.

1. බලංගොඩ, ඉබ්බන්කටුව ප්‍රදේශවල ය.
2. පාහියන්ගල,ඉබ්බන්කටුව ප්‍රදේශවල ය.
3. පොම්පරිප්පුව, බෙල්ලන්බැඳි පැලැස්ස ප්‍රදේශවල ය.
4. පොම්පරිප්පුව, ඉබ්බන්කටුව ප්‍රදේශවල ය.

04. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස උතුරු ප්‍රදේශයෙන් හමු වී ඇත. එම ප්‍රදේශ වන්නේ,

1. මාන්කුලම්, පොම්පරිප්පුව, ඉරණමඩු ය.
2. මාන්කුලම්, පොම්පරිප්පුව, බුලත්සිංහල ය.
3. මාන්කුලම්, රාවණා ඇල්ල, ඉරණමඩු ය.
4. මාන්කුලම්, කිතුල්ගල, ඉරණමඩු ය.

05. බලංගොඩ මානවයා තිරුවානා ගල්වලින් සාදා ගත් මෙවලම් අතර,

1. පොරොව, ඇඹරුම්ගල්, කඩුව, වංගෙඩි වැදගත් ය.
2. හිරමනය, ඇඹරුම්ගල්, දාගල්, වංගෙඩි වැදගත් ය.
3. පොරොව, ඇඹරුම්ගල්, දාගල්, වංගෙඩි වැදගත් ය.
4. පොරොව,ඇඹරුම්ගල්, පිහිය, වංගෙඩි වැදගත් ය.

06. රට අභ්‍යන්තරයේ විසූ ආදි මානවයාගේ ඉතා ජනප්‍රිය ම ආහාරය බවට පත් වූයේ

1. හක්බෙල්ලන් ය. 2. ගස්බෙල්ලන් ය.

3. දඬුලේනුන් ය. 4. මුහුදුඌරන් ය.

07. ශ්‍රී ලංකාවේ සංගමන් කන්ද තුඩුවේ සිට කොළඹ දක්වා දුර ප්‍රමාණය කොපමණ ද?

1. කිලෝ මීටර් 342 කි. 2. කිලෝ මීටර් 224 කි.

3. කිලෝ මීටර් 285 කි. 4. කිලෝ මීටර් 422 කි.

08. පල්ලව රජුගෙන් යුදමය ආධාර ලබා ගත් රජතුමා කවුරුන් ද?

1. දෙවන මුගලන් රජතුමා 2. තුන්වන සේන රජුතුමා

3. මානවම්ම රජතුමා 4. පළමුවන මිහිඳු රජතුමා

09. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් විසින් විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරන ලද වර්ෂය කුමක් ද?

1. ක්‍රි. ව. 1805 2. ක්‍රි. ව. 1918

3. ක්‍රි. ව. 1906 4. ක්‍රි. ව. 1873

10. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන්නේ,

1. පොල් ගස ය. 2. නා ගස ය.

3. ඇසටු ගස ය. 4. නුග ගස ය.

11. ලක්දිව මහායාන බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ මූලස්ථානය ලෙස හඳුන්වන් වනු ලැබූයේ,

1. ජේතවන විහාරය යි. 2. මිරිසවැටි විහාරය යි.

3. අභයගිරි විහාරය යි. 4. ථූපාරාම විහාරය යි.

12. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ මූලිකත්වයෙන් ක්‍රි.ව.1747 දී සියම් දේශයෙන් උපසම්පදාව ගෙන එන ලදි. මේ සඳහා

1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ සහාය ලැබුණි. 2. නරේන්ද්‍රසිංහ රජුගේ සහාය ලැබුණි.

3. රාජාධි රාජසිංහ රජුගේ සහාය ලැබුණි. 4. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සහාය ලැබුණි.

13. ක්‍රි. පූ. 10000ට පමණ පෙර මිනිසුන් ජීවත් වූ යුගය හඳුන්වනු ලබන්නේ,

1. ගොවි යුගයය ලෙස යි. 2. දඩයම් යුගය ලෙස යි.

3. එඬේර යුගය ලෙස යි. 4. මධ්‍යතන යුගය ලෙස යි.

14. ලොව පැරණිතම නාගරික ශිෂ්ටාචාරය,

1. සුමේරියානු ශිෂාටාචාරය යි 2. බැබිලෝනියානු ශිෂාටාචාරය යි

3. මෙසපොතේමියානු ශිෂාටාචාරය යි 4. හරප්පා ශිෂාටාචාරය යි

www.pirivena.lk

15. බැබිලෝනියානු නගරයේ තිබූ පූජා මන්දිර සංඛ්‍යාව,

1. 55කි. 2. 65කි.

3. 85කි. 4. 75කි.

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

16. 1. අනුරාධ ගාම 2. උරුවෙල ගාම

3. උපතිස්ස ගාම 4. කාචර ගාම

17. 1. දේවානම්පියතිස්ස රජතුමා 2. දුටුගැමුණු රජතුමා

3. මහා පරාක්‍රමබාහු රජතුමා 4. වළගම්බා රජතුමා

18. 1. බද්දේගම වාදය 2. උදම්විට වාදය

3. අකිරිය වාදය 4. පානදුරා වාදය

19. 1. බෞද්ධ 2. දෙමළ

3. හින්දු 4. ඉස්ලාම්

20. 1. ගුප්ත රාජධානි යුගය 2. පැරණි රාජධානි යුගය

3. මධ්‍යම රාජධානි යුගය 4. නූතන රාජධානි යුගය

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙක-ටනොගැළපේ. එම නොගැළපෙන පද යුගලය තෝරා ඊට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

21. 1. අනුරාධ ගාම - මල්වතු ඔය අසල

2. උරුවෙල ගාම - කලා ඔය අසල

3. උපතිස්ස ගාම - කනදරා ඔය අසල

4. විජිත ගාම - කිරිඳි ඔය අසල

22. 1. කුරුණෑගල යුගය - සිංහල බෝධි වංශය

2. දඹදෙණි යුගය - පූජාවලිය

3. මහනුවර යුගය - ලෝවැඩ සඟරාව

4. පොලොන්නරු යුගය - අමාවතුර

23. 1. ප්‍රාචීන භාෂෝපකාර සමාගම - ක්‍රි.ව. 1902

2. පිරිවෙන් උපදේශන සභා - ක්‍රි.ව. 1943

3. පිරිවෙන් ව්‍යවස්ථා මාලාව - ක්‍රි.ව. 1863

4. පිරිවෙන් අධ්‍යාපන පනත - ක්‍රි.ව. 1979

24. 1. ශ්‍රී ලංකා පිරිවෙන් කොඩියේ කහපාට පසුබිම - සඟ සසුනේ අනන්‍යතාව

2. ශ්‍රී ලංකා පිරිවෙන් කොඩියේ නෙළුම් මල් හතර - සතර බ්‍රහ්ම විහරණ

3. ශ්‍රී ලංකා පිරිවෙන් කොඩියේ ධර්ම චක්‍රය -අශෝක අධිරාජයාගේ ධර්ම චක්‍රය ෙ

4. ශ්‍රී ලංකා පිරිවෙන් කොඩියේ දුඹුරු පාට කොටස - විනය ශාසනයේ ආයුෂය

25. 1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය - ඇමරිකාව

2. මිසර ශිෂ්ටාචාරය - උතුරු අප්‍රිකාව

3. මොහෙන්ජෝදාරෝ හරප්පා ශිෂ්ටාචාරය - වයඹදිග ඉන්දියා

4. හොවැංහෝ ශිෂ්ටාචාරය - චීනය

- අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවල දක්වා ඇති 'ල ඊල ක හා ෂ යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක සඳහන් පිළිතුර තෝරන්න.

26. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කැණීම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A පාහියන්ගල ලෙන ආශ්‍රිත ව මිනිස් ඇටසැකිලි හමු වී ඇත.

B බෙල්ලන්බැඳිපැලැස්සේ කළ කැණීම්වලින් මිනිස් ඇටකැබලි සොයා ගෙන ඇත.

C බටදොඹ ලෙනේ කළ කැණීම්වලින් හමු වූ මිනිස් හිස්කබල පහට බෙදා ඇත.

D රාවණා ඇල්ල ගුහාවෙන් හමු වූ මිනිස් හිස් කබල දෙකට බෙදා හිල් විද ගුරුගල් ආලේප කර ඇත.

1. A සහ B 2. B සහ C 3. C සහ D 4. A සහ D

27. එක් එක් යුගවල බිහි වූ පිරිවෙන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A මහින්ද සේල පිරිවෙන .- දඹදෙණි යුගය.

B දෙවුන්දර නන්දන පිරිවෙන .- පොලොන්නරු යුගය.

C විදාගම ශ්‍රී සනානන්ද පිරිවෙන -. කුරුණෑගල යුගය.

D කැරගල පද්මාවතී පිරිවෙන -. කෝට්ටේ යුගය.

1. A සහ B 2. B සහ C 3. C සහ D 4. A සහ D

28. ශ්‍රී ජයවර්ධනපුර රාජධානි සමය සම්බන්ධයේ නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A යුරෝපා ජාතීන්ට මෙරටට පැමිණීමට නොහැකි විය.

B විවිධ වසංගත රෝග පැතිරී තිබුණි.

C සංඝ සමාජයට රාජ්‍ය අනුග්‍රහය නොලැබුණි.

D දේශීය ආර්ථිකය ඉතා ශක්තිමත්ව දියුණු මට්ටමක තිබුණි.

1. A සහ B 2. B සහ C 3. C සහ D 4. A සහ D

29. ශ්‍රී ලංකාවේ ජාතික ගීය නිර්මාතෘ කමිටුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A ආචාර්ය ඩී. එච්. ඩී. ඒ.විජේසේකර මහතා

B එස්. එල්. බී. කපුකොටුව මහතා

C එස්. ඩබ්ලිව්. ආර්. බණ්ඩාරනායක මහතා

D පී. බී. ජයසුන්දර මහතා

1. A සහ B 2. B සහ C 3. C සහ D 4. A සහ D

30. හොවැංහෝ සමාජය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?

A රදළරුවන් සුවපහසු ව ආරක්ෂිත ව ජීවත් වූහ.

B සාමාන්‍ය ජනයා දුක්ඛිත ජීවිතයක් ගත නොකළහ.

C අධිරාජ්‍ය පාලකයන්ට අතවැසි පාලන ප්‍රදේශ නොතිබුණි.

D චෞ යුගයේ වැඩවසම් ලක්ෂණ සමාජයේ මුල් බැසගෙන තිබුණි.

1. A සහ B 2. B සහ C 3. C සහ D 4. A සහ D

- අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම ප්‍රකාශන සමූහයක් ඛ හා ශ තීරුවල දී ඇත. එම නාම ප්‍රකාශන කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට නිවැරදි වරණය තෝරන්න.

31.

| | X | | Y |
|---|---|---|---|
| 1. | භණ්ඩුක උපාසකයා පැවිදි කිරීම | A | මිහිඳු මහ රහත්න් වහන්සේ |
| 2. | ථූපාරාම චෛත්‍යය ඉදි කිරීම. | B | සංඝමිත්තා මෙහෙණින් වහන්සේ |
| 3. | ජය ශ්‍රී මහා බෝධිය රැගෙන ඒම. | C | දේවානම්පියතිස්ස රජතුමා |
| 4. | ජේතවන චෛත්‍ය ඉදි කිරීම. | D | ධාතුසේන මහ රජතුමා |

1. B,A,D,C 2. D,B,A,C 3. A,B,DC 4. A,C,B,D

32.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අනුරාධපුර යුගය | A | සිංහල බෝධි වංසය |
| 2. | දඹදෙණි යුගය | B | පූජාවලිය |
| 3. | පොලොන්නරුව යුගය | C | රසවාහිනිය |
| 4. | කුරුණෑගල යුගය | D | මහාවංසය |

1. B,A,D,C 2. D,B,A,C 3. A,B,D,C 4. A,C,B,D

33.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පානදුරා වාදය | A | අනගාරික ධර්මපාල තුමා |
| 2. | මහා බෝධි සමාගම | B | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි |
| 3. | රත්නපුර පැල්මඩුල්ල විද්‍යාස්ථානය | C | සරණංකර සංඝරාජ හිමි |
| 4. | සාරාර්ථ සංග්‍රහය | D | ගාල්ලේ මේධංකර හිමි |

1. BADC 2. DBAC 3. ABDC 4. ACBD

34.

| | X | | Y |
|---|---|---|---|
| 1. | යුප්‍රටීස් ටයිග්‍රීස් නදිය | A | චීන ශිෂ්ටාචාරය |
| 2. | නයිල් නදිය | B | මිසර ශිෂ්ටාචාරය |
| 3. | හොවැංහෝ නදිය | C | මොහෙන්ජොදාරෝ රජ්පා ශිෂ්ටාචාරය |
| 4. | ඉන්දු නදිය | D | මෙසපොතේමියානු ශිෂ්ටාචාරය |

1. B,A,D,C 2. D,B,A,C 3. A,B,D,C 4. A,C,B,D

35.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ෂං රජ පෙළපත | A | චීන අක්ෂර කලාව ආරම්භ වීම. |
| 2. | චෞ රජ පෙළපත | B | ඉදි කිරීම. |
| 3. | චිං රජ පෙළපත | C | කොන්ෆියුසියස් තුමා ජීවත් වූ යුගය. |
| 4. | හැන් රජ පෙළපත | D | කොරියාව යටත් කර ගැනීම. |

1. B,A,D,C 2. D,B,A,C 3. A,B,D,C 4. A,C,B,D

- අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයන්හි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලයන්ට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය ද යි තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයෙහි සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | වසභ රජතුමා මහ වැව් 11 ඉදිකළේ ය. | ලම්භකර්ණ රාජ වංසයේ ආරම්භක පාලකයා විය. |
| 37 | ගුත්තිල කාව්‍යය ග්‍රන්ථය කෝට්ටේ යුගයේ දී රචනා කරන ලදි. | සිංහල ජාතක පොත දඹදෙණි යුගයේ දී රචනා කර ඇත. |
| 38 | ජාතික කොඩියේ කොළ පාට තීරුවෙන් දෙමළ ජනයා නියෝජනය වේ. | ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව පාපන්දු ක්‍රීඩාව යි. |
| 39 | ක්‍රි.ව. 1689 ජුනි 19 දින සංඝරාජ හිමි පැවිද්ද ලබා ගත්තේ ය. | අධ්‍යාපන කොමිෂන් සභාව ක්‍රි.ව. 1867 පිහිටුවන ලදි. |
| 40 | මව් දෙවඟන පිදීම සිදු කරන ලද්දේ නයිල් නිම්න වැසියන් විසිනි. | මිසර පරිපාලනය පාලන ඒකක 42කට බෙදා තිබුණි. |

| | |
|---|---|
| | # මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020 |
| | ## Primary Piriven Year End Test - 2020 |
| | **03 ශ්‍රේණිය/Grade 03** |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **ඉතිහාසය** I, II<br>**History Science** I, II |

**ඉතිහාසය II**

සැලකිය යුතු යි :

i. අංක 01 ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

ii. මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.

---

01.

i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ත්‍රිකුණාමලය | 2. | වලවේ ගඟ |
| 3. | අනුරාධපුර | 4. | යාපනය |
| 5. | සංගමන්කන්ද තුඩුව | 6. | පාහියන්ගල |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

ii. පහත දී ඇති රූපසටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. A රූපයේ දැක්වෙන ස්තූපය හඳුන්වන නම කුමක් ද?
2. එය කර වූ රජතුමා කවුරුන් ද?
3. මෙය පිහිටා ඇති නගරය කුමක් ද?



iii. 1. B රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

2. එය කුමන ශිෂ්ටාචාරයට අයත් ද?

3. මෙම රූපයේ දැක්වෙන ගොඩනැගිල්ලේ සුවිශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න.



02 ''ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ආදි මානවයා මෙරට විවිධ ප්‍රදේශවල ජීවත් වූ බවට සාධක ඇත."

I ලක්දිව ආදි මානවයා විසූ ප්‍රදේශ ඇතුළත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II ප්‍රාග් මනවයා වාසය කළ වාසස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 04)

III ආදි ප්‍රාග් මානවයා තම වාසස්ථාන සඳහා ලක්දිව විවිධ ප්‍රදේශ තෝරා ගැනීමට හේතුව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03 "දේවානම්පියතිස්ස රාජ යුගය ලාංකීය සංස්කෘතියේ වැදගත් යුගයකි ."

I දේවානම්පියතිස්ස රජු දෙවන අභිෂේකයේ දී යොදා ගත් කකුධ භාණ්ඩ දෙකක නම් ලියන්න. (ලකුණු 02)

II ලක්දිවට වැඩම කළ ප්‍රථම ධර්ම දූත කණ්ඩායමට අයත් දෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 04)

III දෙවනපෑතිස් යුගයේ දී මෙරට සංස්කෘතියේ දියුණුව සිදු වූ අයුරු කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04 "ලක්දිව රජකම් කළ ධාතුසේන මහ රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකි."

I ධාතුසේන රජතුමා කරවූ විහාරාරාම දෙකක නම් ලියන්න. (ලකුණු 02)

II ධාතුසේන රජතුමා කරවූ වැව් හතරක නම් ලියන්න. (ලකුණු 04)

III ධාතුසේන මහ රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05

I කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය දියුණු ව පැවති බව උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

II අනුරාධපුර යුගයේ දී මෙරට බෞද්ධ අධ්‍යාපන ක්‍රමය දියුණු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06

I මිනිසා ශිෂ්ටාචාර ගතවීමට පෙර ජීවත් වූ පූර්ව ශිලා යුග පිළිබඳ ව පැහැදිලි කරන්න. ලකුණු 06)

II ශිෂ්ටාචාරයක තිබිය යුතු පොදු ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07

I සුමේරියානු ශිෂ්ටාචාරයේ ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

II හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරය පිළිබඳ ව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08 පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ ව ඓතිහභාසික තොරතුරු කෙටියෙන් සඳහන් කරන්න.

I වලගම්බා රජතුමාගේ රාජ්‍ය පාලනය.

II මහනුවර යුගයේ සාහිත්‍යයික දියුණුව.

III ශ්‍රී ලංකා පිරිවෙන් කොඩිය.

Iv නයිල් නිම්න ශිෂ්ටාචාරය

(ලකුණු 06 + 60 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**ඉතිහාසය - I, II** **3 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

සැලකිය යුතුයි :
- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ❖ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ❖ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- **අංක 1 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ''අතීත සිද්ධීන් පිළිබඳ දැනුම වනාහී මනුෂ්‍ය ස්වභාවය නිවැරදි කිරීම සඳහා ප්‍රබලතම උපකරණය වේ.'' මෙම නිර්වචනය ඉදිරිපත් කළ පුද්ගලයා කවුරුන් ද?
   1. ඩියඩෝරස් 2. හෙරඩෝටස් 3. E. H. කර් 4. පොලිබියස්

02. කුරුවිට ආසන්නයේ පිහිටි බටදොඹලෙන අයත්වන දිස්ත්‍රික්කය කුමක් ද?
   1. නුවරඑළිය දිස්ත්‍රික්කය 2. කළුතර දිස්ත්‍රික්කය
   3. රත්නපුර දිස්ත්‍රික්කය 4. කෑගල්ල දිස්ත්‍රික්කය

03. ඉබ්බන්කටුව සුසාන භූමියෙන් සොයා ගන්නා ගන්නා ලද්දේ මොනවාද?
   1. අස්ථි කොටස් 2. හිස් කබල් 3. මැටි භාණ්ඩ 4. ආහාරපාන

04. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය 'වර්ග සැතපුම්' කොපමණද?
   1. 65,610 2. 35,481 3. 45,321 4. 25,481

05. මහා පරාක්‍රමබාහු රජුගේ ලීලාවතී බිසව අයත් වන රාජවංශය කුමක් ද?
   1. ලම්බකර්ණ වංශය 2. පාණ්ඩ්‍ය වංශය 3. මානවම්ම වංශය 4. කාලිංග වංශය

06. පෘතුගීසි ජාතිකයන් අප රටට පැමිණී සියවස කුමක් ද?
   1. 16 වන සියවස 2. 12 වන සියවස 3. 10 වන සියවස 4. 20 වන සියවස

07. විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයක් ඇතුළත් පිළිතුර කුමක් ද?
   1. පාහියන් වාර්තාව 2. දීපවංසය
   3. මහාවංසය 4. කල්‍යාණී ශිලා ලිපිය

08. පණ්ඩුකාභය රජුගේ මව කවුරුන් ද?
   1. භද්දකච්චායනා 2. ස්වර්ණපාලී 3. උලකුඩය දේවිය 4. උන්මාද චිත්‍රා

09. පණ්ඩුකාභය රජු විසින් සොත්ථිසාලා නිර්මාණය කරදෙනු ලැබුයේ කවුරුන් උදෙසා ද?
   1. බ්‍රාහ්මණයන් සඳහා 2. බෞද්ධයන් සඳහා 3. ආජීවකයන් සඳහා 4. පරිබ්‍රාජකයන් උදෙසා

10. වසභ රජතුමා විසින් ඉදිකළ මහ වැව් සංඛ්‍යාව කොපමණද?
   1. 11 යි. 2. 12 යි. 3. 16 යි. 4. 18 යි.

11. මෞර්ය අභිෂේක ක්‍රමයට අවශ්‍ය උපකරණයක් ඇතුළත් නොවන පිළිතුර කුමක් ද?
   1. අරුණුවන් මැටි   2. සේසත   3. වල් විදුණාව   4. වාමවෘත සංඛය

12. සංඝමිත්තා තෙරණිය දඹකොළ පටුනට (වරායට) ගොඩ බැස්සේ කුමන අවධියක දී ද?
   1. ක්‍රි. පූ. 247 පමණ ය.   2. ක්‍රි. පූ. 300 පමණ ය.
   3. ක්‍රි. පූ. 250 පමණ ය.   4. ක්‍රි. පූ. 100 පමණ ය.

13. වළගම්බා රජ දවස ලංකාවට පැමිණි ආක්‍රමණිකයන් ගොඩබට වරාය වන්නේ කුමක් ද?
   1. ගෝකණ්ණ   2. කාලතිත්ථ   3. මහාතිත්ථ   4. හීමතිත්ථ

14. කලාවැව නිර්මාණය ලද්දේ කුමන රජු විසින් ද?
   1. වසභ රජු   2. දේවානම්පියතිස්ස රජු   3. මහසෙන් රජු   4. ධාතුසේන රජු

15. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නොවන්නේ කුමක් ද?
   1. පාහියන්ගල   2. කිතුල්ගල බෙලිලෙන   3. බුන්දල   4. මිහින්තලේ

- **16 - 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබාදී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. තිස්ස රජු   2. පණ්ඩුල බ්‍රාහ්මණ   3. අරිට්ඨ ඇමති   4. මල්ල ගණකයා

17. 1. පේදුරුතුඩුව   2. කළුතර   3. දෙවුන්දරතුඩුව   4. සංගමන්කන්ද

18. 1. නාලන්දා   2. වික්‍රමශීලා   3. ඕදන්ත පූරි   4. උත්තරෝල්හ

19. 1. අමෝඝවජ්‍ර හිමි   2. බුද්ධඝෝෂ හිමි   3. පාහියන් හිමි   4. සංඝමිත්‍ර

20. 1. සසදාවත   2. බුත්සරණ   3. අමාවතුර   4. දළදා සිරිත

- **21 -25 තෙක් ප්‍රශ්නවල පද යුගල හතර බැගින් ලබාදී ඇත. ඒවා අතුරෙන් එක් යුගලක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21. 1. සියබස්ලකර - අනුරාධපුර යුගය   2. බුත්සරණ - පොලොන්නරු යුගය
    3. අමාවතුර - දඹදෙනි යුගය   4. සිංහල ජාතක පොත - කුරුණෑගල යුගය

22. 1. 1864 - උදන්විට වාදය   2. 1865 - වරාගොඩ වාදය
    3. 1873 - පානදුරා වාදය   4. 1864 - බද්දේගම වාදය

23. 1. සොත්ථිසාලා - බ්‍රාහ්මණයන්   2. පණ්ඩුකාභය - දමිලාධිකාරී
    3. කාලවේල - චිත්තරාජ   4. විජය - පඩුවස්දෙව්

24. 1. අනුරාධ ගාම - මල්වතු ඔය   2. උරුවේල ගාම - කලා ඔය
    3. උපතිස්ස ගාම - මැණික් ගඟ   4. රාම ගෝණ - මහවැලි ගඟ

25. 1. හොවැංහෝ - ෂං පෙළපත   2. නයිල් - පාරාවෝ
    3. අනුරාධපුරය - මෞරිය පෙළපත   4. චීනය - පැපිරස්

- **අංක 26 - 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ( *A*), ( *B*), ( *C* ) හා ( *D* ) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. පොලොන්නරු රාජධානි සමයේ දී,
   A. සියලු භික්ෂූන් උපාධ්‍යායන් යටතේ වසර දහයක් අධ්‍යාපනය ලැබීය.
   B. නවක භික්ෂූන් උපසම්පදාව ලැබූ උපාධ්‍යායන් යටතේ වසර පහක් අධ්‍යාපනය ලැබීය.
   C. මධ්‍යම භික්ෂූන් උපසම්පදාවෙන් වසර පහකට පසු ගුරුවරයාගෙන් මිදේ.
   D. ස්ථවිර භික්ෂු තත්ත්වය ලැබෙන්නේ වසර පහළවකට පසුය.
   1. A සහ B   2. B සහ C   3. A සහ D   4. C සහ D

27. ජාතික කොඩිය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

A. කොළ පාට තීරුව මුස්ලිම් ජනතාව නියෝජනය කරයි.

B. තැඹිලි පාට තීරුව දෙමළ ජනතාව නියෝජනය කරයි.

C. ජාතික උත්සවයක දී මෙන්ම ආගමික උත්සවයක දී ජාතික කොඩිය එසවීම අනිවාර්ය නොවේ.

D. කේශර හා වලිගයෙන් ප්‍රකාශ වන්නේ පාලකයා හා රටවැසියා අතර සමානාත්මතාව නොවෙයි.

1. A සහ B 2. B සහ C 3. A සහ D 4. C සහ D

28. සංඝරාජ සරණංකර හිමියන්ගේ ශාසනික, සමාජීය හා සාහිත්‍ය සේවාවන් සම්බන්ධව නිවැරදි ප්‍රකාශයන් අඩංගු වන්නේ මින් කුමක් ද?

A. ගඩලාදෙණිය සද්ධර්මතිලක විහාරය උසස් විද්‍යාස්ථානයක් බවට පත් කිරීම.

B. සාමණේරයන් වහන්සේලාට ධර්ම කරුණු බෙදා දීමට මහාබෝධි සමාගම ඇරඹීය.

C. ක්‍රි.ව. 1505 දි කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස තායිලන්තයට දූතයන් යවා භික්ෂු උපසම්පදාව රැගෙන එන ලදී.

D. සාරාර්ථ සංග්‍රහය සංඝරාජ හිමියන්ගේ රචනාවක් වේ.

1. A සහ B 2. B සහ C 3. A සහ D 4. A සහ D

29. අනුරාධපුර යුගයෙහි පිරිවෙන් සම්බන්ධ නිවැරදි තොරතුර අඩංගු පිළිතුර කුමක් ද?

A. විධිමත් ඉගැන්වීමකට විධිමත් මධ්‍යස්ථානයක උවමනාව වටහා ගත් රජවරු පමණක් පිරිවෙන් තැනීය.

B. ථේරවාදයට මෙන්ම මහායාන අධ්‍යාපනයටත් පිරිවෙන් ආරම්භ කරන ලදී.

C. රෝහණයේ තිස්ස මහා පිරිවෙන එකල පැවති සුප්‍රසිද්ධ පිරිවෙනකි.

D. සංඝමිත්‍ර නම් ද්‍රවිඩ භික්ෂුන් වහන්සේ මහා විහාර පිරිවෙනේ පරිවේණාචාර්ය වරයෙකි.

1. A සහ B 2. B සහ C 3. A සහ D 4. B සහ C

30. රජරට සිටි රජවරුන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ මින් කුමක් ද?

A. දසමහා යෝධයන් දුටුගැමුණු රජුගේ ප්‍රධානම සේනාංකය වේ.

B. වංකනාසිකතිස්ස රජු මරා ෂට් ද්‍රවිඩයන් බලය ලබා ගත්තේය.

C. පරාක්‍රම සමුද්‍රය තැනූ ධාතුසේන රජු තම පුතණුවන් අතින් මැරුම් කෑවේය.

D. මූටසීව රජුගෙන් පසු ලක්දිව රජ වුයේ දේවානම්පියතිස්ස රජතුමාය.

1. A සහ B 2. B සහ C 3. A සහ D 4. C සහ D

- **31 - 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දි ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයට ගැළපේ එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

31.

| X | Y |
|---|---|
| 1. උබයිඩ් අවධිය | A. මෙසපොතේමියාව |
| 2. එල්ලෙන උද්‍යානය | B. පාරාවෝ |
| 3. ටුත්මෝසීස් | C. මමී |
| 4. ලිනන් රෙදි පටි | D. සුමේරියාව |

1. D B C A 2. D A B C 3. A B C D 4. C A B D

32. X — Y

1. රතු මුහුද
2. කවන්ධ නග්න රූප
3. චීන මහා ප්‍රාකාරය
4. කොන්ෆියුසියස්

A. චෞ පෙළපත
B. සේදමාවත
C. ෂී හුංවා දී
D. හරප්පා

1. B C D A 2. B C A D 3. B D C A 4. A C D B

33. X — Y

1. වසභ රජු
2. ධාතුසේන රජු
3. තිරිතර
4. වේළු සුමන

A. දුටුගැමුණු රජු
B. කලා වැව
C. ලම්භකර්ණ වංශය
D. පාරින්ද

1. B D A C 2. C B D A 3. B C A D 4. C A B D

34. X — Y

1. 1873
2. 1880
3. 1902
4. 1875

A. පරම විඥානාර්ථ සමාගම
B. විද්‍යාලංකාර පිරිවෙන
C. ප්‍රාචීන භාෂෝපකාර සමාගම
D. විද්‍යෝදය පිරිවෙන

1. D B C A 2. D A C B 3. A B C D 4. C D B A

35. X — Y

1. සැළලිහිණි සන්දේශය
2. භක්ති ශතකය
3. ගුත්තිල කාව්‍යය
4. ලෝවැඩ සඟරාව

A. රාමචන්ද්‍ර කවි භාරති
B. වීදාගම මෛත්‍රී හිමි
C. තොටගමුවේ රාහුල හිමි
D. වැත්තෑවේ හිමි

1. C A B D 2. C A D B 3. B A C D 4. A C B D

- **36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට දී ඇති ප්‍රකාශ යුගලයට ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.**

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය | නිවැරදි ය |
| 2 | නිවැරදි ය | වැරදි ය |
| 3 | වැරදි ය | වැරදි ය |
| 4 | වැරදි ය | නිවැරදි ය |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | මධ්‍යශිලා යුගයේ විසූ මානවයා බලංගොඩ මානවයා ලෙස හැඳින් වේ. | පළමුවන බුවනෙකබාහු රජු යාපහුවේ දළදා මන්දිරයක් තැනවී ය. |
| 37. | ආර්යන්ගේ මුල් භූමිය මැද පෙරදිග කාන්තාර භූමියකි. | ලන්දේසීන්ගේ පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ ජාවා දූපතේ බතාවිය යි. |
| 38. | ''මහා කළු සිංහලයා පලා යනවෝ'' කියා කෑගැසුවේ ගිරි නම් නිගණ්ඨයෙකි. | පෞර රාජ්‍ය යනු ඉන්දියාවේ පැවති දේශපාලන ඒකක විශේෂයකි. |
| 39. | ලෝවාමහාපාය සද්ධාතිස්ස රජුගේ ආගමික නිර්මාණයකි. | උතුරු හා දකුණු රෝම අධිරාජ්‍යය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කෙරිණි. |
| 40. | අමාවතුර අනුරාධපුර යුගයේ දී රචනාකර ඇත. | බින්දුසාර රජු මිසරය හා ග්‍රීසිය සමග තානාපති සබඳතා පැවැත්වීය. |

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - I, II** **3 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණුකර නම් කරන්න.

1. අනුරාධපුරය 2. පේදුරු තුඩුව 3. කොළඹ
4. මහියංගනය 5. ගාල්ල 6. මහවැලි ගඟ

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(අ) මෙම රූපයේ දැක්වෙන චිත්‍රය කුමක් ද?
(ආ) මෙම චිත්‍රය නිර්මාණය කරවූ රජතුමා කවුරුන් ද?
(ඉ) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

(ලකුණු 1 × 3 = 3)



iii. (අ) මෙම රූපයේ දැක්වෙන ස්තූපය කුමක් ද?
(ආ) එය කරවූ රජතුමා කවුරුන් ද?
(ඉ) මෙම ස්තූපය කුමන රාජධානියට අයත් වී ද?

(ලකුණු 1 × 3 = 3)

02. i. අනුරාධපුර යුගයේ පැවති ආගමික විශ්වාස දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. අනුරාධපුර යුගයේ පාලනය ගෙන ගිය මෞර්ය වංශික රජවරු හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 04)
iii. ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික විශ්වාසයන් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

03. i. පංච මහා වාද අතුරින් වාද දෙකක් නම් කරන්න. (ලකුණු 02)
ii. අතීත ලංකාවේ පැවති පිරිවෙන් ආයතන 04 ක් නම් කරන්න. (ලකුණු 04)
iii. අසරණ සරණ සරණංකර හිමියන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

04. ප්‍රශ්න හතරකට පමණක් කෙටි පිළිතුරු සපයන්න.

i. ඉන්දුනිම්න ශිෂ්ටාචාරය (ලකුණු 02)

ii. අනගාරික ධර්මපාල තුමා (ලකුණු 04)

iii. දුටුගැමුණු රජතුමා (ලකුණු 06)

iv. ජාතික කොඩිය (ලකුණු 03)

v. ජාතික ගීය (ලකුණු 03)

vi. කලා වැව (ලකුණු 03)

05. i. නයිල් නිම්න ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුණු දායාද දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. චීනයේ පැවති රාජවංශ හතර නම් කරන්න. (ලකුණු 04)

iii. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පැවතී නාගරික ලක්‍ෂණ දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

06. i. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. දඹදෙණි යුගයේ රචනා කළ සාහිත්‍ය ග්‍රන්ථ හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. අනුරාධපුර යුගයේ පිරිවෙන්වල පැවති අධ්‍යාපනය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

07. i. අනුරාධපුර යුගයේ වගා කළ කන්න දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අනුරාධපුර යුගයේ සහ පොලොන්නරු යුගයේ ඉදි කළ වැව් දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04)

iii. වළගම්බා රජු පිළිබඳව හැදින්වීමක් කරන්න. (ලකුණු 06)

08. i. ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාස පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලක්දිවට පැමිණි ප්‍රධාන භාරතීය ජන කණ්ඩායම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii. ආර්ය ජනාවාස පිහිටුවා ගැනීමෙන් අනතුරුව ග්‍රාම පාලනය සිදු වූ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06)



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**

அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் – *பிரிவேனா கல்விக் கிளை*

State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**


**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**

Year End Term Test – 2021 (2022)

**ඉතිහාසය - II**

**සැලකිය යුතුයි :**

- දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා බාර දෙන්න.



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**ඉතිහාසය - I, II** **3 ශ්‍රේණිය**

# ඉතිහාසය - I

සැලකිය යුතුයි :

- ❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ. (1 × 40 = 40)
- ❖ අංක 01 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල , දී ඇති (1) , (2) , (3) , (4) යන වරණ අතරින් නිවැරදි හෝ වඩාත් යෝග්‍ය වරණය තෝරා ඔබට ලැබී ඇති පිළිතුරු පත්‍රයේ අදාල කවය තුළ (×) ලකුණ යොදන්න.

➢ අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ඉතිහාසය යනු මිනිසුන් පිළිබඳ කෙරෙන අධ්‍යනයක් බව ප්‍රකාශ කළේ,
   (1) ජී.එම්.ට්‍රෙවිලියන් (2) ඊ.එච්.කාර් ය.
   (3) පොලිබියස් ය. (4) ශ්‍රී ජවහර්ලාල්නේරු ය.

02. උතුරු ප්‍රදේශයට අයත් ප්‍රාග් ඓතිහාසික ප්‍රදේශයකි.
   (1) පොම්පරිප්පුව (2) බූන්දල (3) රාවණා ඇල්ල (4) බෙලිලෙන

03. ගුරු ගල් ආලේපනය කළ ඇටසැකිල්ලක් හමු වූයේ,
   (1) ඉබ්බන්කටුවෙන් (2) බෙල්ලන්බැඳිපැලැස්සෙන්
   (3) ඉරණමඩුවෙන් (4) පාහියන්ගලින්

04. විජය සමඟ පැමිණි පිරිස විසින් පිහිටුවා ගත් ජනපදයක් වන්නේ,
   (1) රාමගෝණගාම (2) උපතිස්සගාම (3) දීඝායුගාම (4) මහාගාම

05. පණ්ඩුකාභය කුමරු ආරක්ෂිතව හැදී වැඩුණු ගම කුමක් ද?
   (1) තම්මැන්නාව (2) අනුරාධගාම (3) විජිතගාම (4) දොරමඬලාව

06. පණ්ඩුකාභය රජු ඉදිකළ "සිවිකාශාලා" යනු,
   (1) ශිව ලිංගය තැන්පත් කළ ශාලාවක් (2) රාජ සභා මණ්ඩපයක්
   (3) ධර්ම ශාලාවක් (4) කාලවේල යක්ෂයාගේ නිවාසය

07. දේවානම්පියතිස්ස රජු අශෝක අධිරාජ්‍යයා වෙත යැවූ දූත පිරිස නැව් නැග්ගේ,
   (1) ජම්බුකෝලපට්ටන වරායෙනි. (2) මහාතිත්ථ වරායෙනි.
   (3) ගොඩවාය වරායෙනි. (4) කොළඹ වරායෙනි.

08. සංඝමිත්තා තෙරණිය සමඟ පිරිස ලංකාවට පැමිණියේ,

(1) දුරුතු පුර පොහොය දින ය. (2) වෙසක් පුර පොහොය දින ය.

(3) උඳුවප් පුර පොහොය දින ය. (4) නවම් පුර පොහොය දින ය.

09. දුටුගැමුණු රජු ඉදිකළ ලෝවාමහාපාය,

(1) කණු මත ඉදිකළ ස්තූපයකි. (2) උපෝසථාගාරයකි.

(3) තෙමහල් ධර්ම මන්දිරයකි. (4) ආරෝග්‍ය ශාලාවකි.

10. දසමහා යෝධයන් අතරින් පැවිදිභාවයට පත් වූ අයෙකු වන්නේ,

(1) නන්දිමිත්‍ර (2) ගෝඨයිම්බර (3) වේලුසුමන (4) ථෙරපුත්තාභය

11. බැමිණිතියාසාය ඇති වූයේ,

(1) දුටුගැමුණු රාජ්‍ය සමයේ ය. (2) සද්ධාතිස්ස රාජ්‍ය සමයේ ය.

(3) වළගම්බා රාජ්‍ය සමයේ ය. (4) වසභ රාජ්‍ය සමයේ ය.

12. අභයගිරිය ඉදි කොට පූජා කළේ,

(1) මහානාම හිමියන්ට (2) කුපික්කලතිස්ස හිමියන්ට

(3) කොහොන්තිස්ස හිමියන්ට (4) මිහිඳු හිමියන්ට

13. අනුරාධපුර යුගයේ රචනා නොවූ ග්‍රන්ථයක් වන්නේ කුමක් ද?

(1) අමාවතුර (2) සියබස්ලකර

(3) වංසත්තප්පකාසිනිය (4) සමන්තපාසාදිකාව

14. මේ අතරින් ජාතික කොඩියේ දක්නට නොලැබෙන්නේ,

(1) කහපාට (2) රෝසපාට (3) තැඹිලිපාට (4) කොළපාට

15. ලොව පැරණිම නීති සංග්‍රහය හමු වූයේ,

(1) ඉන්දුනිම්න ශිෂ්ඨාචාරයෙනි.

(2) ඊජිප්තු ශිෂ්ඨාචාරයෙනි.

(3) බැබිලෝනියානු ශිෂ්ඨාචාරයෙනි.

(4) හොවැංහෝ ශිෂ්ඨාචාරයෙනි.

➢ අංක 16 සිට 20 තෙක් ඒක් ඒක් ප්‍රශ්නය සඳහා වරණ හතර බැගින් දී ඇත. ඒවා අතුරින් ඒක් වරණයක් කවර හෝ හේතුවක් නිසා අනෙක් ඒවා සමඟ නොගැලපේ. එම නොගැලපෙන වරණය තෝරන්න.

16. (1) ඔස්ට්‍රොලොයිඩ් (2) මධ්‍යධරණී (3) මොංගොලොයිඩ් (4) හෝමෝසේපියන්

17. (1) රූපාර් (2) ගාන්ධාර (3) සුක්තජෙන්ඩෝර් (4) අලම්ගීර්පූර්

18. (1) ෂං (2) චෞ (3) චිං (4) බීජිං

19. (1) උබයිඩ් අවධිය (2) උරුක් අවධිය (3) අක්කඩ් අවධිය (4) මිසර අවධිය

20. (1) ගල් විහාරය (2) දෙමළමහාසෑය (3) රන්කොත් වෙහෙර (4) තිවංක පිළිමගෙය

➢ අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒ අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද ඒකිනෙක නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) ඉන්දුනිම්න ශිෂ්ටාචාරය - මව් දෙවඟන
(2) ඊජිප්තු ශිෂ්ටාචාර - පිරමීඩ
(3) හොවැංහෝ ශිෂ්ටාචාරය - චීන මහා ප්‍රාකාරය
(4) හරප්පා ශිෂ්ටාචාරය - එල්ලෙනා උද්‍යාන

22. (1) ජාතික ගීය - ආනන්ද සමරකෝන්
(2) ජාතික කොඩිය - ජේ.ආර්.ජයවර්ධන
(3) රාජ්‍ය ලාංඡනය - සෙනරත් පරණවිතාන
(4) ජාතික ක්‍රීඩාව - රොබට් වෝල්ටර්

23. (1) 1773 - විද්‍යෝදය පිරිවෙන (2) 1873 - පානදුරා වාදය
(3) 1880 - පරම විඥානාර්ථ සමාගම (4) 1875 - විද්‍යාලංකාර පිරිවෙන

24. (1) පළමුවන විජයබාහු රජු - අනුරාධපුර යුගය
(2) පළමුවන පරාක්‍රමබාහු රජු - පොළොන්නරුව
(3) දෙවන පරාක්‍රමබාහු රජු - දඹදෙණි යුගය
(4) හතරවන මිහිඳු රජු - මහනුවර යුගය

25. (1) දේවානම්පියතිස්ස රජු - අරිට්ඨ (2) එළාර රජු - දීඝජන්තු
(3) වළගම්බා රජු - මිගාර (4) වසභ රජු - ඉසිගිරිය

➢ අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා A, B, C, D ලෙස ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරින් දෙකක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

A සහ B පමණක් නිවැරදි නම් අංක 01 ද,
B සහ C පමණක් නිවැරදි නම් අංක 02 ද,
C සහ D පමණක් නිවැරදි නම් අංක 03 ද,
A සහ D පමණක් නිවැරදි නම් අංක 04 ද, සලකුණු කරන්න.

26. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස,
(A) විටින් විට පැමිණි ජන කණ්ඩායම් මගින් ජනාවාස ආරම්භ වීම.
(B) ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය සඳහා භූගෝලීය සාධක බලපාන ලදී.
(C) මුල්ම ජනාවාස පිහිටුවා ගත්තේ දකුණු හා ඌව පළාතේ ය.
(D) මේ ජනාවාස පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක රැසක් සොයාගෙන ඇත.

(1) AB (2) BC (3) CD (4) AD


www.pirivena.lk

27. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම,

(A) ඉන්දියාවට ආසන්නව පිහිටිය ද කිසිදු බලපෑමක් සිදුව නොමැත.

(B) ඉන්දියාවට ආසන්නව පිහිටීම රාජතාන්ත්‍රික සම්බන්ධතා ශක්තිමත් වීමට හේතු විය.

(C) මධ්‍ය කඳුකරයේ පිහිටීම රට එක්සේසත් කිරීමට පහසුවක් විය.

(D) ලංකාව ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම ලංකාවේ ස්වාධීනත්වයට තර්ජනයක් විය.

(1) AB (2) BC (3) CD (4) AD

28. ඉන්දියාවේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරය,

(A) මෙහි ආරම්භය විදේශීය සම්භවයකින් සිදු වූ බවට මතයක් ඇත.

(B) එය නැගෙනහිර ඉන්දියාවේ පිහිටා ඇත.

(C) මේ ශිෂ්ටාචාරයේ මුල්ම වරට තොරතුරු හඳුනාගත්තේ සෙනරත් පරණවිතාන මහතා ය.

(D) සර් ජෝන් මාෂල් මහතාගේ මූලිකත්වයෙන් ක්‍රි.ව. 1921 සිට ඒහි ස්ථාන දෙකක කැණීම් සිදු කළේය.

(1) AB (2) BC (3) CD (4) AD

29. කොන්ෆියුසියස්තුමා,

(A) මෙතුමා ක්‍රිස්තුන් වහන්සේට සමකාලීනයෙකු වේ.

(B) ෂං රාජවංස යුගයේ දී උපත ලද අයෙකි.

(C) ගුරුවරයෙකු වශයෙන් ද කටයුතු කළේය.

(D) අක්ෂර ශික්ෂාව, සාහිත්‍ය, ආචාර ධර්ම හා දර්ශනවාදය පිළිබඳ දැනුමක් ලබා දුනි.

(1) AB (2) BC (3) CD (4) AD

30. ජාතික අනන්‍යතාවන්,

(A) ලොව සෑම රටකටම ජාතික අනන්‍යතාවන් නොමැත.

(B) ශ්‍රී ලංකාවේ ජාතික සමගිය හා ප්‍රගතිය ජාතික කොඩියේ සංකේතවත් කරයි.

(C) එහි ඇති වර්ණවලින් සිංහල, දෙමළ, මුස්ලිම් ජනවර්ග සංකේතවත් කරයි.

(D) බෝ ගස ද ජාතික අනන්‍ය වෘක්ෂයක් ලෙස සැලකේ.

(1) AB (2) BC (3) CD (4) AD

➢ අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙකි. නාම/ ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන X තීරුවේ ඇති නාම/ ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුවේ ඒවා X තීරුවේ අනුපිළිවෙලට සකස් කල විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | | | Y |
|---|---|---|---|
| (1) පණ්ඩුවාසදේව | - | A | මුටසීව රජුගේ පුතා ය. |
| (2) දේවානම්පියතිස්ස | - | B | සද්ධාතිස්ස රජුගේ පියා ය. |
| (3) කාවන්තිස්ස | - | C | වළගම්බා රජුගේ පියා ය. |
| (4) සද්ධාතිස්ස | - | D | පණ්ඩුකාභයගේ සීයා ය. |

(1) ABDC (2) BACD (3) CABD (4) DABC

32. X Y

(1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි - A බුදුගුණාලංකාරය
(2) වීදාගම මෛත්‍රිය හිමි - B කාව්‍යශේඛරය
(3) ධම්මදින්න විමලතිස්ස හිමි - C කෝකිල සංදේශය
(4) ඉරුගල්තිලක පිරිවෙන්පති හිමි - D සද්ධර්මරත්නාකරය

(1) ABDC (2) BADC (3) CADB (4) DCBA

33. X Y

(1) ථූපාරාමය - A ධාතුසේන රජු
(2) සෝමාවතී - B දුට්ඨගාමිණී අභය
(3) මංගන විහාරය - C දේවානම්පියතිස්ස රජු
(4) මිරිසවැටිය - D වළගම්බා රජු

(1) ACBD (2) BADC (3) CDAB (4) DACB

34. X Y

(1) නා ගස - A ශ්‍රී ලංකාවට උරුම වූවකි.
(2) නිල්මානෙල් මල - B උපුල්වන් දෙවියන් හා සම්බන්ධය.
(3) වළිකුකුළා - C ආගමික උරුමයකි.
(4) බෝගස - D දිවයින පුරා වනාන්තර ආශ්‍රිතව දැකගත හැකිය.

(1) ABDC (2) BCAD (3) CABD (4) DCAB

35. X Y

(1) දීඝසන්ධ පිරිවෙන - A දඹදෙණි යුගය
(2) ජේතවනාරාම පිරිවෙන - B කෝට්ටේ යුගය
(3) දෙවුනුවර නන්දන පිරිවෙන - C අනුරාධපුර යුගය
(4) එරබන්තොටධර්මරාජ පිරිවෙන - D පොළොන්නරු යුගය

(1) ABCD (2) CDAB (3) CADB (4) DCAB

➢ අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළ දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා එහි අංකය සලකුණු කරන්න.

| වර්ණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 01 | නිවැරදිය | නිවැරදිය |
| 02 | නිවැරදිය | වැරදිය |
| 03 | වැරදිය | නිවැරදිය |
| 04 | වැරදිය | වැරදිය |


www.pirivena.lk

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | ලොව වඩාත් පැරණිම අක්ෂර මෙසපොතේමියානු අක්ෂර වේ. | ඔවුන් පැපිරස් මිශ්‍ර හා මැටි පළක ලේඛන සඳහා භාවිතා කර ඇත. |
| 37. | චීන භාෂාවේ  ,  ලෙස දැක්වෙන්නේ "ගස" යන වචනය යි. | කැස්බැලෙලිවල ලියූ අක්ෂර ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වේ. |
| 38. | ලොව විශාල පිරමීඩ දක්නට ලැබෙන්නේ හොවැංහෝ ශිෂ්ටාචාරයෙනි. | යෝගී ඉරියව්වෙන් සිටින පුරුෂ දෙවියාගේ රුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වේ. |
| 39. | ලංකාවේ ජාතික කොඩියේ සිංහයාගේ හිසේ කේසර හා වලිගයේ ඉහල කොටසින් පාලකයා හා රටවැසියා අතර සමානාත්මතාව අර්ථවත් වේ. | පිරිවෙන් කොඩියේ කහපාට පසුබිමෙන් භික්ෂුව භාවිතා කරන චීවරය ගැන කිය වේ. |
| 40. | පිරිවෙන් අධ්‍යාපනයේ නියමුවා සංඝරාජ හිමිය. | උන්වහන්සේ මහනුවර නියමකන්ද විහාරයේ මුල්ම පිරිවෙන ආරම්භ කළේය. |



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**ඉතිහාසය - I , II** **3 ශ්‍රේණිය**

## ඉතිහාසය - II

සැලකිය යුතුයි :

❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. ජම්බුකෝල පට්ටන 2. ගල්ඔය 3. කෝට්ටේ
4. මාගම 5. පොළොන්නරුව 6. මහනුවර

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

➢ පහත දී ඇති A හා B රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. (අ) A වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙම රූපයේ සශ්‍රීකත්වය හා සෞභාග්‍ය සංකේතවත් කරන්නේ කුමකින් ද?
(ඉ) මෙහි ඇති නෙළුම් පෙති (පළාපෙති) වලින් සංකේතවත් කරන්නේ කුමක් ද?
(ලකුණු 03)



A

iii. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(ආ) එය කර වූ පාලකයා කවුද?
(ඉ) එය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(ලකුණු 03)



B

02. i. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන 02 ක් නම් කරන්න. (ලකුණු 02)
ii. මෙරටට පැමිණි ඉන්දීය ජන කණ්ඩායම් 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)
iii. පණ්ඩුකාභය රාජ්‍ය අවධියේ වැදගත්කම කරුණු 02 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

03. i. අනුරාධපුර යුගයේ මහවැව් ඉදි කළ පාලකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. දුට්ඨගාමිණී අභය රජු මුහුණදුන් අභියෝග 02 ක් දක්වන්න. (ලකුණු 04)

iii. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ ඇති වැදගත්කම කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. i. පැරණි භාරතයේ පැවැති බෞද්ධ විශ්වවිද්‍යාල 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. අනුරාධපුර යුගයේ පැවැති මහායාන අධ්‍යාපන ආයතන 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුව සාධක 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. ශ්‍රී ලංකාවේ (ජාතික කොඩිය හැර) ජාතික අනන්‍යතා සංකේත 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ නිර්මාණ කමිටුවේ සිටි සාමාජිකයින් අතරින් දෙදෙනෙකු දක්වන්න. (ලකුණු 04)

iii. ජාතික කොඩිය ප්‍රදර්ශනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. ලොව පැරණි ශිෂ්ටාචාර 02 ක් නම් කරන්න. (ලකුණු 02)

ii. ලොව ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා තම ආහාර සොයාගත් ආකාරයන් දෙකක් දක්වන්න. (ලකුණු 04)

iii. මානව ශිෂ්ටාචාරවලට පොදු ලක්ෂණ 02 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. i. පැරණි ශිෂ්ටාචාර බිහිවීම කෙරෙහි බලපෑ සාධක 02 ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. බැබිලෝනියා ශිෂ්ටාචාරයේ හමුරාබි රජුගේ නීති සංග්‍රහයේ වැදගත්කම කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

i. මහින්දාගමනය

ii. පැරණි පිරිවෙන් අධ්‍යාපනය

iii. කාවන්තිස්ස රජතුමා

iv. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

(ලකුණු 6 × 2 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 3 ශ්‍රේණිය

## (07) ඉතිහාසය - I, II

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### ඉතිහාසය I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

* අංක 01 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ''ඉතිහාසය එක් විෂයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය යි.'' ඉතිහාසය සම්බන්ධයෙන් මෙම නිර්වචනය ඉදිරිපත් කළේ කවුරුන් ද?
1. ඊ.එච්.කාර් 2. ඩියඩෝරස් 3. ජී.එම්.ට්‍රෙව්ලියන් 4. පොලිබියස්

02. ඉතිහාසය හැදෑරීමේ ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක් ද?
1. අතීතය හඳුනාගැනීම. 2. අන්‍ය මතවලට ගරු කිරීම.
3. ජනවාර්ගික ගැටුම් ඇති වීම. 4. අතීතයෙන් පාඩම් ඉගෙනීම.

03. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස සැලකෙන්නේ,
1. ක්‍රි. පූ. හයවන සියවසෙන් පෙර ය. 2. ක්‍රි. පූ. හයවන සියවසට පසුව ය.
3. ක්‍රි. පූ. හත්වන සියවසෙන් පසුව ය. 4. ක්‍රි. පූ. පස්වන සියවසෙන් පෙර ය.

04. ''කුරුවිට බටදොඹලෙන'' අයත් දිස්ත්‍රික්කය වන්නේ,
1. කෑගල්ල දිස්ත්‍රික්කය 2. රත්නපුර දිස්ත්‍රික්කය 3. නුවරඑළිය දිස්ත්‍රික්කය 4. කළුතර දිස්ත්‍රික්කය

05. උතුරු ප්‍රදේශයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නොවන්නේ කුමක් ද?
1. මාන්කුලම් 2. මිනිහා ගල් කන්ද 3. ඉරණමඩු 4. පොම්පරිප්පු

06. පුරාවිද්‍යා පර්යේෂණවලට අනුව මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය වසර කොපමණ කාලයක් පැරණි ද?
1. වසර 12500 2. වසර 175000 3. වසර 115000 4. වසර 125000

07. බලංගොඩ මානවයාට අයත් අස්ථි කොටස් සොයා ගෙන ඇති ස්ථානය කුමක් ද?
1. බටදොඹලෙන 2. බෙල්ලන් බැඳි පැළැස්ස
3. කිතුල්ගල බෙලිලෙන 4. අත්තනගොඩ අළුලෙන

08. පාහියංගල ලෙනෙන් හමු වූ මිනිස් ඇටසැකිලි වසර කීයක් පැරණි ද?
1. වසර 18000 2. වසර 31000 3. වසර 28000 4. වසර 41000

09. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සුසාන භූමියක් හමු නොවන ස්ථානය කුමක් ද?
1. ඉබ්බන්කටුව 2. පොම්පරිප්පුව 3. බලංගොඩ 4. ගල්සොහොන් කනත්ත

10. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් කීය ද?
1. 65610 2. 65625 3. 65410 4. 65320

11. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් කෙරෙන මුහුදු තීරයෙහි දුර කොපමණ ද?
1. කි.මී.25 2. කි.මී.32 3. කි.මී.43 4. කි.මී.35

12. මෙරට වියළි කලාපයට ඊසානදිග මෝසම් මගින් වර්ෂාව ලැබෙන කාල සීමාව කුමක් ද?
    1. අගෝස්තු - ජනවාරි
    2. ඔක්තොම්බර් - අප්‍රේල්
    3. සැප්තැම්බර් - පෙබරවාරි
    4. දෙසැම්බර් - මැයි

13. දකුණු ඉන්දියාව ආක්‍රමණය කළ මෙරට පාලකයෙක් වන්නේ,
    1. නිශ්ශංකමල්ල රජු ය.
    2. II වන පරාක්‍රමබාහු රජු ය.
    3. I වන පරාක්‍රමබාහු රජු ය.
    4. I වන විජයබාහු රජු ය.

14. ස්ටෙප්ස් තණබිම් නිජබිම කර ගත් ආර්යයන් කොටස් දෙකකට බෙදී බටහිරට හා දකුණට සංක්‍රමණය වූයේ කුමන අවධියේ දී ද?
    1. ක්‍රි. පූ.1800 දී ය.
    2. ක්‍රි. පූ.2000 දී ය.
    3. ක්‍රි. පූ.2100 දී ය.
    4. ක්‍රි. පූ.2500 දී ය.

15. ආර්යයන් ඉන්දියාවට සංක්‍රමණය වූ කාලය වන්නේ මින් කුමක් ද?
    1. ක්‍රි. පූ.1500
    2. ක්‍රි. පූ.2000
    3. ක්‍රි. පූ.1800
    4. ක්‍රි. පූ.1600

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

16. 1. මහාවංසය 2. පාහියන් වාර්තා 3. දීපවංසය 4. සමන්ත පාසාදිකාව

17. 1. අනුරාධගාම 2. උපතිස්සගාම 3. ඉබ්බන්කටුව 4. උරුවෙලගාම

18. 1. මල්වතු ඔය 2. කලාඔය 3. කනදරා ඔය 4. යාං ඔය

19. 1. පණ්ඩුකාභය 2. වසභ 3. ධාතුසේන 4. නිශ්ශංකමල්ල

20. 1. අභයගිරි ස්තූපය 2. රුවන්වැලි මහාසෑය 3. මිරිසවැටිය 4. ලෝවාමහපාය

- **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල යුගල පද හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන පද යුගලයට අදාළ අංකය තෝරා පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

21. 1. අනුරාධගාම - මල්වතු ඔය
    2. උරුවෙලගාම - කලා ඔය
    3. විජිතගාම - මහවැලි ගඟ
    4. උපතිස්සගාම - ගල් ඔය

22. 1. දේවානම්පියතිස්ස රජු - මහින්දාගමනය
    2. වළගම්බා රජු - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
    3. වසභ රජු - වල්ලිපුරම් රන්පත
    4. ධාතුසේන රජු - ලම්භකර්ණ වංශය

23. 1. රුවන්වැලි සෑය - දුටුගැමුණු රජු
    2. අභයගිරි විහාරය - වළගම්බා රජු
    3. අවුකන විහාරය - වසභ රජු
    4. ථූපාරාමය - දේවානම්පියතිස්ස රජු

24. 1. බැමිණිතියාසාය - සත් ද්‍රවිඩ ආක්‍රමණ
    2. වසභ රජු - මධ්‍යගත පාලනය
    3. ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණ - මහසෙන් රාජ්‍ය සමය
    4. අභයගිරිය - මහායාන බෞද්ධ අධ්‍යාපනය

25. 1. මහාවංසය - අනුරාධපුර යුගය
    2. අමාවතුර - පොලොන්නරු යුගය
    3. පූජාවලිය - කෝට්ටේ යුගය
    4. දළදා සිරිත - කුරුණෑගල යුගය

www.pirivena.lk

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් දෙකක් නිවැරදිය. ඒවා අතුරින් නිවැරදි ප්‍රතිචාර දෙක තෝරන්න.**

26. වසභ රාජ්‍ය සමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ තෝරන්න.
    A. මධ්‍යගත පාලනය ශක්තිමත්ව පවත්වා ගැනීම.
    B. ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණ එල්ල වීම.
    C. මෙරට ප්‍රථම වරට නිකාය භේදය සිදු වීම.
    D. ප්‍රථම වරට මහ වැව් ඉදි කිරීම ආරම්භ වීම.
    1. A සහ B ය. 2. A සහ D ය. 3. B සහ D ය. 4. C සහ D ය.

27. පිරිවෙන යනු කුමක් ද? යන්නට නිවැරදි ප්‍රකාශ වන්නේ,
    A. භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම කරන ස්ථානය.
    B. භික්ෂූන් වහන්සේලා ධර්මය ප්‍රගුණ කරන ස්ථානය.
    C. භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන මධ්‍යස්ථානය.
    D. භික්ෂූන් වහන්සේලා දන් පිළිගන්නා ස්ථානය.
    1. A සහ C ය. 2. B සහ D ය. 3. B සහ C ය. 4. C සහ D ය.

28. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගෙන් පිරිවෙන් අධ්‍යාපනයට සිදු වූ සේවාවන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
    A. පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන ආරම්භ කිරීමට කටයුතු කිරීම.
    B. මහින්දසේන පිරිවෙන ආරම්භ කිරීම.
    C. මහනුවර නියමකන්ද විහාරස්ථානයෙහි ප්‍රථම පිරිවෙන ආරම්භ කිරීම.
    D. ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරයෙහි උසස් විද්‍යාස්ථානයක් ඇති කිරීම.
    1. A සහ B ය. 2. B සහ D ය. 3. A සහ C ය. 4. C සහ D ය.

29. ජාතික කොඩිය එසවීම සම්බන්ධයෙන් නිවැරදි අවස්ථාවන් වන්නේ,
    A. විශේෂ ජාතික උත්සවයක දී
    B. වෙසක් පොහොය දිනයේ දී
    C. පිරිවෙනක, පාසලක හෝ රාජ්‍ය ආයතනයක උත්සවයක දී
    D. සිංහල හින්දු අලුත් අවුරුදු දිනයේ දී
    1. A සහ B ය. 2. A සහ C ය. 3. B සහ C ය. 4. A සහ D ය.

30. ගොවි යුගයේ මානවයා කෘෂිකාර්මික කටයුතු සඳහා ගංගා නිම්න ප්‍රදේශ තෝරා ගැනීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
    A. පහසුවෙන් ජලය ලබා ගැනීමට හැකි වීම නිසා.
    B. වන සතුන්ගෙන් වගාවට හානියක් නොවන නිසා.
    C. ගංගා නිතර පිටාර ගැලීම නිසා ගංගා නිම්න දෙපස සරුසාරවත් භූමියක් පැවතීම.
    D. ගංගා මාර්ගයෙන් අස්වැන්න ප්‍රවාහනය කිරීම පහසු නිසා.
    1. A සහ B ය. 2. C සහ D ය. 3. B සහ C ය. 4. A සහ C ය.

www.pirivena.lk

- අංක 31 සිට 36 තෙක් දක්වා ඇති නාම / ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. X තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන Y තීරුවේ නාම / ප්‍රකාශන සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. X තීරුවේ ඒවා Y තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| 1. අනුරාධපුර යුගය | A. ආලාහණ පිරිවෙන |
| 2. පොලොන්නරු යුගය | B. වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන |
| 3. දඹදෙණි යුගය | C. මයුර පිරිවෙන |
| 4. කුරුණෑගල යුගය | D. මහින්දසේන පිරිවෙන |

1. C D B A  2. C A D B  3. B A D C  4. D A C B

32.

| X | Y |
|---|---|
| 1. මහානාම හිමි | A. සැලළිහිණි සංදේශය |
| 2. වැත්තෑවේ හිමි | B. මහාවංසය |
| 3. වීදාගම මෛත්‍රී හිමි | C. ගුත්තිල කාව්‍යය |
| 4. තොටගමුවේ රාහුල හිමි | D. ලෝවැඩ සඟරාව |

1. B C D A  2. C D B A  3. A B D C  4. B C A D

33.

| X | Y |
|---|---|
| 1. දුටුගැමුණු රජු | A. අවුකන විහාරය |
| 2. පණ්ඩුකාභය රජු | B. ථූපාරාමය |
| 3. ධාතුසේන රජු | C. මිරිසවැටිය |
| 4. දේවානම්පියතිස්ස රජු | D. සිවිකා සාලා |

1. C A B D  2. C D A B  3. D C A B  4. C B A D

34.

| X | Y |
|---|---|
| 1. වෘක්ෂ වන්දනාව | A. ප්‍රාප්ති දානමය පිංකම් |
| 2. පර්වත වන්දනාව | B. පහන් පූජා |
| 3. ගිනි පූජා | C. බෝධි වන්දනාව |
| 4. මළවුන් පිදීම | D. ස්තූප වන්දනාව |

1. D C B A  2. C D B A  3. A D C B  4. C B A D

35.

| X | Y |
|---|---|
| 1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය | A. හොවැංහෝ නදිය |
| 2. මිසර ශිෂ්ටාචාරය | B. ඉන්දු නදිය |
| 3. හරප්පා ශිෂ්ටාචාරය | C. යුප්‍රටීස් - ටයිග්‍රීස් |
| 4. හොවැංහෝ ශිෂ්ටාචාරය | D. නයිල් නිම්නය |

1. D C A B  2. A C B D  3. C D B A  4. B A C D

- අංක 36 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | වළගම්බා රාජ්‍ය සමයේ පළමු වරට නිකාය භේදය සිදු විය. | වසභ රජු විසින් තිසා වැව කරවන ලදී. |
| 37. | සිංහල ජාතක පොත කෝට්ටේ රාජ්‍ය සමයේ ලියැවී ඇත. | මෙරට සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය යි. |
| 38. | ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගස යි. | නිල් මානෙල් මල ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය යි. |
| 39. | දඩයම් යුගයේ මිනිසා ස්ථිර වාසස්ථාන තනා ඇත. | එඬේර යුගයේ මානවයා සංචාරක දිවියක් ගත කළේ ය. |
| 40. | ක්‍රි.පූ.6000 දී පමණ සුමේරියානු ශිෂ්ටාචාරය ආරම්භ වී ඇත. | බැබිලෝනියානු සමාජය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය. |

* * *

සියලුම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All rights reserved |

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**3 ශ්‍රේණිය**

**(07) ඉතිහාසය - I, II**

**සැලකිය යුතුයි :**

*** පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. කොළඹ
2. අනුරාධපුරය
3. මිහිඟු ගල් කන්ද
4. පේදුරු තුඩුව
5. ත්‍රිකුණාමලය
6. දෙවුන්දර තුඩුව

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 × 6 = 06)

ii. පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

(අ) A රූපයේ දැක්වෙන ස්ථානය කුමක් ද?

(ආ) මෙම නිර්මාණය කරවූ රජතුමා කවුරුන් ද?


(ඉ) මෙය කුමන රාජධානි සමයට අයත් ගොඩනැගිල්ලක් ද?

(ලකුණු 1 × 3 = 3)

iii. (අ) B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) එය කුමන රජුගේ රාජ්‍ය සමයට අයත් වේ ද?

(ඉ) මෙම ලේඛනයේ සඳහන් ඇමතිවරයා කවුරුන් ද?



B රූපය

(ලකුණු 1 × 3 = 3)

02. i. ලංකාවට පැමිණි භාරතීය ජන සංක්‍රමණ පිළිබඳ සඳහන් දේශීය සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මෙරටට පැමිණි භාරතීය ජන කණ්ඩායම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පණ්ඩුකාභය රජුගේ ආගමික ප්‍රතිපත්ති තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i. බෞද්ධ අධ්‍යාපනය පදනම් කර ගනිමින් ලොව බිහි වූ මුල් ම විශ්වවිද්‍යාල දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අනුරාධපුර යුගයේ බිහි වූ පිරිවෙන් ආයතන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

04. i. ශ්‍රී ලංකා ජාතික කොඩියේ නිර්මාතෘ කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ දක්නට ලැබෙන සංකේත හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතිය උදෙසා වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි කළ මෙහෙවර කරුණු තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

05. i. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර පිණිස යොදා ගෙන ඇති සතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. මෙරටින් හමු වෙන ප්‍රාග් ඓතිහාසික ස්ථාන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ අවමංගල්‍ය චාරිත්‍ර විධි දෙකක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. i. වසභ රජු විසින් ඉදි කළ වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. මිත්තසේන රජ දවස මෙරට ආක්‍රමණය කළ ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගෙන් සිව් දෙනෙකු සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ධාතුසේන රජු ආර්ථික වශයෙන් සිදු කළ සේවාව කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

07. i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පදනම් කර ගෙන බිහි වූ ශිෂ්ටාචාර දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. චීනයේ පැවති රාජවංශ හතර දක්වන්න. (ලකුණු 04)

iii. බැබිලෝනියානු ශිෂ්ටාචාරයේ සමාජ තත්ත්වය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. පහත සඳහන් මාතෘකාවලින් **හතරකට** කෙටි සටහන් සපයන්න.

i. දුටුගැමුණු රජතුමා

ii. වළගම්බා රජුගේ ශාසනික මෙහෙවර

iii. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ දේශපාලනික බලපෑම

iv. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම

v. කෝට්ටේ යුගයේ විසූ පඬිවරුන්

vi. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආගමික විශ්වාස හා පුද පූජා

(ලකුණු $3 \times 4 = 12$)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 07 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**3 ශ්‍රේණිය**

**(07) ඉතිහාසය - I, II**

**සැලකිය යුතුයි :**

* දෙවන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01 (I) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

